අ.පො.ස (උ.පෙළ) විභාගය - 2016

ඇගයීම් වාර්තාව

33 - ගිණුම්කරණය

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2016

ඇගයීම් වාර්තාව

33 - ගිණුම්කරණය



පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

ගිණුම්කරණය

ඇගයීම් වාර්තාව - අ.පොෂ.ස.(උ.පෙළ) විභාගය - 2016

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස
පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ
ව්‍යාපෘතිය (TSEP-WB) මගින්

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පොෂ.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2016 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 211865ක් පාසල් අයදුම්කරුවෝ ද 46328ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පොෂ.(උ.පෙළ) ගිණුම්කරණය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ගිණුම්කරණය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පොෂ.(උ.පෙළ) 2016 විභාගයේ ගිණුම්කරණය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2017 දෙසැම්බර් 01
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

උපදේශකත්වය	:	බී. සනත් පූජිත විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ/සංවර්ධන හා ඇගයීම්)
සම්බන්ධීකරණය	:	බුද්ධිකා පෙරේරා නියෝජ්‍ය විභාග කොමසාරිස්
සංස්කරණය	:	ආචාර්ය ඩබ්.වී.ඒ.ඩී. කරුණාරත්න ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණකාධිකරණ අධ්‍යයන අංශය කැලණිය විශ්ව විද්‍යාලය ආචාර්ය හරේන්ද්‍ර කාරියවසම් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණකාධිකරණ අධ්‍යයන අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය රංගජීව හේරත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණකාධිකරණ අධ්‍යයන අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	චන්ද්‍රානි රූපසිංහ රාජසිංහ මධ්‍ය විද්‍යාලය, හංවැල්ල. ප්‍රේමණී ප්‍රනාන්දු ශාන්ත පීතර විදුහල, කොළඹ 04 නලීන් රුවන් කුමාර අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය, අනුරාධපුර බී.එම්. හතරසිංහ විශාඛා උසස් බාලිකා විද්‍යාලය, බදුල්ල. පද්මිණී හේවාගීගන විශාඛා විද්‍යාලය, කොළඹ 05 ඊ.එම්. නවරත්න කුලි/කුලියාපිටිය මධ්‍ය විද්‍යාලය, කුලියාපිටිය.
පරිගණක පිටපත සැකසුම	:	කේ.ඒ. ඉරෝෂා බණ්ඩාර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර III
පිටකවරය සැකසුම	:	වයි.එස්. අනුරාධි සංවර්ධන නිලධාරි

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1 විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

II කොටස

2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 8
2.1.2. I ප්‍රශ්න පත්‍රයේ 1 සිට 30 තෙක් ප්‍රශ්න 9
2.1.3. I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 15
2.1.4. I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 16
2.1.5. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 22
2.1.6. I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය ප්‍රතිශත ලෙස 23
2.1.7. I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය ප්‍රතිශත ලෙස 26

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 28
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, නිරීක්ෂණ, නිගමන හා යෝජනා 29
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 62

III කොටස

3 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 63
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 64

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 ගිණුම්කරණය විෂයයෙහි අභිමතාර්ථ

මෙම විෂය හැදෑරීමෙන් ශිෂ්‍යයා,

* ගිණුම්කරණ සංකල්පීය රාමුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.
* ගිණුම්කරණ ශිල්පීය ක්‍රම පිළිබඳ ලබාගත් මූලික දැනුම භාවිතයට ගනියි.
* ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් විවෘතව ඇති නව්‍යතා අවබෝධ කර ගනියි.
* ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් ලබාගන්නා වූ දැනුම විවිධ වෘත්තීය අවශ්‍යතා සඳහා භාවිතයට ගනියි.
* සමාජ ආර්ථික පරිසරය තුළ ඵලදායි ලෙස කටයුතු කළ හැකි කළමනාකරණ කුසලතා ලබා ගනියි.
* විවිධ ව්‍යාපාර සංවිධානවල ගිණුම් තැබීම පිළිබඳ කුසලතා ලබා ගනියි.
* විෂය ක්ෂේත්‍රය තුළ ගවේෂණය තුළින් ලැබෙන හුරුව අනාගත පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට දායක කර ගනියි.
* සම්පත් කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා වර්ධනය කර ගනියි.

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	41764	4230	45994
දෙමළ	7504	948	8452
ඉංග්‍රීසි	1997	797	2794
එකතුව	**51265**	**5975**	**57240**

වගුව 1

1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	7775	15.17	603	10.09	8378	14.64
B	5692	11.10	448	7.50	6140	10.73
C	9965	19.44	735	12.30	10700	18.69
S	14811	28.89	1581	26.46	16392	28.64
F	13022	25.40	2608	43.65	15630	27.31
එකතුව	**51265**	**89.56**	**5975**	**10.44**	**57240**	**100.00**

වගුව 2

විභාගයට පෙනී සිටි පාසල් අයදුම්කරුවන්ගෙන් ආසන්න වශයෙන් 75%ක් පමණ ගිණුම්කරණය විෂය සමත් වුවද පෞද්ගලික අයදුම්කරුවන්ගෙන් මෙම විෂය සමත්ව ඇත්තේ ආසන්න වශයෙන් 54%ක් පමණක් බව ඉහත සංඛ්‍යාලේඛන අනුව පැහැදිලි වේ. සමස්ථයක් ලෙස අයදුම්කරුවන්ගෙන් ආසන්න වශයෙන් 73%ක් පමණ ගිණුම්කරණ විෂය සමත් වී ඇත.

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		ලබාගත් සංඛ්‍යාව	%	ලබාගත් සංඛ්‍යාව	%	ලබාගත් සංඛ්‍යාව	%	ලබාගත් සංඛ්‍යාව	%	ලබාගත් සංඛ්‍යාව	%	ලබාගත් සංඛ්‍යාව	%
1. කොළඹ	8293	1490	17.97	953	11.49	1614	19.46	2494	30.07	6551	78.99	1742	21.01
2. ගම්පහ	4899	598	12.21	465	9.49	872	17.80	1511	30.84	3446	70.34	1453	29.66
3. කළුතර	2338	357	15.27	252	10.78	441	18.86	675	28.87	1725	73.78	613	26.22
4. මහනුවර	2755	285	10.34	275	9.98	456	16.55	866	31.43	1882	68.31	873	31.69
5. මාතලේ	726	72	9.92	68	9.37	138	19.01	216	29.75	494	68.04	232	31.96
6. නුවරඑළිය	1108	104	9.39	105	9.48	252	22.74	312	28.16	773	69.77	335	30.23
7. ගාල්ල	2159	325	15.05	231	10.70	398	18.43	562	26.03	1516	70.22	643	29.78
8. මාතර	1276	194	15.20	152	11.91	275	21.55	362	28.37	983	77.04	293	22.96
9. හම්බන්තොට	780	96	12.31	75	9.62	144	18.46	234	30.00	549	70.38	231	29.62
10. යාපනය	877	121	13.80	104	11.86	193	22.01	243	27.71	661	75.37	216	24.63
11. කිලිනොච්චි	152	11	7.24	12	7.89	22	14.47	59	38.82	104	68.42	48	31.58
12. මන්නාරම	197	18	9.14	16	8.12	46	23.35	65	32.99	145	73.60	52	26.40
13. වව්නියාව	330	46	13.94	28	8.48	71	21.52	90	27.27	235	71.21	95	28.79
14. මුලතිව්	142	13	9.15	18	12.68	32	22.54	49	34.51	112	78.87	30	21.13
15. මඩකලපුව	641	119	18.56	93	14.51	120	18.72	161	25.12	493	76.91	148	23.09
16. අම්පාර	858	102	11.89	79	9.21	144	16.78	247	28.79	572	66.67	286	33.33
17. ත්‍රිකුණාමලය	613	61	9.95	72	11.75	90	14.68	190	31.00	413	67.37	200	32.63
18. කුරුණෑගල	2223	280	12.60	210	9.45	405	18.22	615	27.67	1510	67.93	713	32.07
19. පුත්තලම	1229	165	13.43	121	9.85	265	21.56	329	26.77	880	71.60	349	28.40
20. අනුරාධපුරය	1224	119	9.72	118	9.64	210	17.16	389	31.78	836	68.30	388	31.70
21. පොළොන්නරුව	531	75	14.12	49	9.23	99	18.64	142	26.74	365	68.74	166	31.26
22. බදුල්ල	1292	84	6.50	85	6.58	206	15.94	422	32.66	797	61.69	495	38.31
23. මොනරාගල	632	91	14.40	55	8.70	122	19.30	186	29.43	454	71.84	178	28.16
24. රත්නපුරය	1756	318	18.11	196	11.16	342	19.48	447	25.46	1303	74.20	453	25.80
25. කෑගල්ල	1280	176	13.75	118	9.22	242	18.91	364	28.44	900	70.31	380	29.69
සමස්ත දිවයින	**38311**	**5320**	**13.89**	**3950**	**10.31**	**7199**	**18.79**	**11230**	**29.31**	**27699**	**72.30**	**10612**	**27.70**

වගුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	722	1.26	57240	100
81 - 90	3755	6.56	56518	98.74
71 - 80	5536	9.67	52763	92.18
61 - 70	6541	11.43	47227	82.51
51 - 60	7624	13.32	40686	71.08
41 - 50	8895	15.54	33062	57.76
31 - 40	9423	16.46	24167	42.22
21 - 30	8203	14.33	14744	25.76
11 - 20	5593	9.77	6541	11.43
01 - 10	936	1.64	948	1.66
00 - 00	12	0.02	12	0.02

වගුව 4

මෙම විෂය සඳහා අපේක්ෂකයින් ලකුණු ලබාගත් ආකාරය පන්ති ප්‍රාන්තර අනුව ඉහත වගුවේ දැක්වේ. උදාහරණ වශයෙන් ගතහොත් ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා පෙනී සිටි 57240 දෙනා අතුරෙන්, 31-40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 9423 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 16.46%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 24167ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 42.22%කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 01 (RD/16/05/AL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

අයදුම්කරුවන් විසින් පළමු ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා තිබෙරදී ව සිසුනුරු සෑපයූ ප්‍රතිශතය ඉහත ප්‍රස්තාරය මගින් පෙන්නුම් කෙරේ.

නිදසුනක් ලෙස : ඉහත ප්‍රස්තාරය අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව සිසුනුරු සපයා ඇත්තේ 01 වන ප්‍රශ්නයට වන අතර, එහි ප්‍රතිශතය 94%කි. අඩුම සංඛ්‍යාවක් නිවැරදි ව සිසුනුරු සපයා ඇත්තේ 43 වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 22%කි.

1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරය මගින් II පත්‍රයේ එක් එක් ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය පැහැදිලි කෙරේ. ඒ අනුව පෙනී යන්නේ අනිවාර්ය ප්‍රශ්න වන 1 සහ 2 ප්‍රශ්න සඳහා ඉතා සුළු පිරිසක් හැර අනෙකුත් සියලුම අපේක්ෂකයින් පිළිතුරු සපයා ඇති බවයි. සෙසු ප්‍රශ්නවලින් අපේක්ෂකයින් වැඩිම පිරිසක් පිළිතුරු සපයා ඇත්තේ II පත්‍රයේ 3 වන ප්‍රශ්නයට වන අතර එම ප්‍රමාණය 95%ක් පමණ වේ. සෙසු ප්‍රශ්න අතුරින් අපේක්ෂකයින් විසින් අඩුවෙන්ම තෝරා ගනු ලැබ ඇත්තේ 06 වන ප්‍රශ්නය වන අතර එය 51%කි.

ප්‍රස්තාරය 02 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරය මගින් II වන ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය පැහැදිලි කෙරේ. නිදසුනක් ලෙස මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. එම ලකුණුවලින් 76%-100% (ලකුණු 16-20) ප්‍රාන්තරයේ ලකුණු ලබාගත් ප්‍රතිශතය 23%ක් පමණි. නමුත් අපේක්ෂකයින් වැඩිම පිරිස එනම් 30%ක් මෙම ප්‍රශ්නය සඳහා ලබාගෙන ඇත්තේ 0%-25% (ලකුණු 0-5) ප්‍රාන්තරයට අයත් ලකුණු ප්‍රමාණයයි.

ප්‍රස්තාරය 03 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4. **II** ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 04 (RD/16/04/AL) පෝරමයෙන් ලබාගත් කොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

II කොටස

2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

* කාලය පැය 02 යි.
* බහුවරණ ප්‍රශ්න 30ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කි.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි.
* එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.
* පිළිතුරු පත් ඇගයීමේදී සෑම ප්‍රශ්නයකට ම ලකුණු 4 බැගින් ලබා දෙනු ඇත. ඒ අනුව මුළු ලකුණු 200 කි.
* අවසාන ලකුණු ගණනය කරන ආකාරය පිළිබඳව 25 පිටුවේ ඇතුළත් වේ.

2.1.2 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න

1. පහත කුමන ප්‍රකාශයෙන් ආයතනයක ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?
(1) ආයතනයක ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීම
(2) ආයතනයක ගනුදෙනු මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා සටහන් කිරීම
(3) ආයතනයක මූල්‍ය වාර්තා ගිණුම්කරණ ප්‍රමිත පදනම්ව පිළියෙල කිරීම
(4) ආයතනය පිළිබඳ තොරතුරු කළමනාකරුවන්ගේ භාවිතය සඳහා සන්නිවේදනය කිරීම
(5) ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම (.....)

2. වත්කම්, ජංගම සහ ජංගම නොවන ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වර්ගීකරණය කිරීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය පදනම් වන්නේ ද?
(1) උපචිත (2) අඛණ්ඩ පැවැත්ම (3) ඓතිහාසික පිරිවැය
(4) කාලච්ඡේද (5) ආරක්ෂණ (.....)

3. වසර අග තොගය, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත හඳුනාගැනීම සඳහා පදනම් වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?
(1) උපචිත (2) කාලච්ඡේද (3) යථාරූපී (4) උපලබ්ධි (5) ආරක්ෂණ (.....)

4. ශ්‍රී ලංකාවේ අනුගමනය කරන 'මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට' අනුව මූල්‍ය තොරතුරුවල වැඩිදියුණු කිරීමේ ගුණාත්මක ගතිලක්ෂණයක් **නො වන්නේ** පහත දැ අතුරෙන් කුමක් ද?
(1) සංසන්දනාත්මක බව (2) විශ්වසනීය නියෝජනය (3) සත්‍යාපනය කළ හැකි බව
(4) කාලීන බව (5) අවබෝධ කරගත හැකි බව (.....)

5. පහත කුමන ප්‍රකාශය ආයතනයක ගිණුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් **නිවැරදි** වේ ද?
(1) සුළු මුදල් පොත ආයතනයක ලෙජර ගිණුමක් ලෙස ද භාවිත කෙරේ.
(2) සියලු මූලික ලියවිලි ආයතනයක ගණකාධිකාරිවරයා විසින් පිළියෙල කරනු ලබයි.
(3) ණය පදනම මත මිල දී ගත් සියලු වත්කම් සටහන් කිරීම සඳහා ගැනුම් ජර්නලය භාවිත කෙරේ.
(4) ආයතනයක ශේෂ පිරික්සුම තුලනය වීම එහි ගිණුම්කරණ ක්‍රියාවලියේ නිවැරදිතාව තහවුරු කරයි.
(5) භාණ්ඩ ණයට විකුණුම් හා බැඳි සාරාංශගත තොරතුරු ණයගැති පාලන ගිණුමේ සටහන් කරයි. (.....)

6. පහත තොරතුරු සීමිත දයා පොදු සමාගමට අදාළ වේ.

	2016.03.31 දිනට (රු.)	**2015.03.31 දිනට (රු.)**
ගෙවිය යුතු කුලී	–	60 000
ගෙවිය යුතු අලුත්වැඩියා වියදම්	40 000	80 000

- 2014.04.01 දින සමාගම රු. 30 000 ක මාසික කුලියකට ගොඩනැගිල්ලක් කුලියට ගන්නා ලදී.
- 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවූ, කුලී සහ අලුත්වැඩියා වියදම් පිළිවෙළින් රු. 480 000 ක් සහ රු. 380 000 ක් විය.

2016.03.31 දිනට කලින් ගෙවූ කුලී සහ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අලුත්වැඩියා වියදම්:

	කලින් ගෙවූ කුලී (රු.)	**අලුත්වැඩියා වියදම් (රු.)**
(1)	60 000	340 000
(2)	60 000	420 000
(3)	120 000	340 000
(4)	480 000	420 000
(5)	480 000	300 000

(.....)

7. 2016.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ආයතනයක් විසින් රු. 900 000 ක ශුද්ධ වැටුපක් ගෙවන ලදී. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක සහ සේව්‍යයාගේ දායකත්වයන් පිළිවෙළින් 10% ක් සහ 15% ක් වන අතර ඒවා 2016 මාර්තු මාසය සඳහා මෙතෙක් ගෙවා නොමැත. සේවකයන්ගේ වැටුපෙන් කරන එක ම අඩු කිරීම සේවක අර්ථසාධක අරමුදල් දායකය වේ. මෙම ගනුදෙනුවල **බලපෑම** ගිණුම්කරණ සමීකරණයේ දක්වනුයේ:

	වත්කම්	**වගකීම්**	**හිමිකම්**
(1)	රු. 900 000 කින් අඩු වේ.	රු. 150 000 කින් වැඩි වේ.	රු. 1 050 000 කින් අඩු වේ.
(2)	රු. 900 000 කින් අඩු වේ.	රු. 100 000 කින් වැඩි වේ.	රු. 1 000 000 කින් අඩු වේ.
(3)	රු. 900 000 කින් අඩු වේ.	රු. 250 000 කින් වැඩි වේ.	රු. 1 150 000 කින් අඩු වේ.
(4)	රු. 1 000 000 කින් අඩු වේ.	රු. 150 000 කින් වැඩි වේ.	රු. 1 150 000 කින් අඩු වේ.
(5)	රු. 1 000 000 කින් අඩු වේ.	–	රු. 1 000 000 කින් අඩු වේ. (.....)

8. 2016.03.31 දිනට සීමිත රේණු පොදු සමාගමේ ශේෂ පිරික්සුම් තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දැ හෙළිදරව් විය:

A - විදුලි වියදම් සඳහා ගෙවූ රු. 200 000 මුදල් ගිණුමෙහි පමණක් සටහන් කර තිබුණි.

B - ගැනුම් ජර්නලය රු. 60 000 ක් වැඩියෙන් එකතු කර තිබුණි.

C - ණයගැතියකුගෙන් ලද රු. 50 000 ක් මුදල් ගෙවීමක් ලෙස ණයහිමි පාලන ගිණුමෙහි සටහන් කර තිබුණි.

D - රු. 40 000 ක විකුණුම් ඉන්වොයිසියක් ණයගැති ලෙජරයේ පමණක් සටහන් කර තිබුණි.

ඉහත කුමන වැරදි අවිනිශ්චිත ගිණුමෙහි ශේෂයක් ඇති වීමට දායක වූයේ ද?

(1) A හා C පමණි. (2) B හා D පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (.....)

9. විවාහ මංගල උත්සව සඳහා ශාලාවක් කුලියට දීමේ නියුතු ව්‍යාපාර ආයතනයක 2016 අප්‍රේල් මාසය තුළ දී පහත ගනුදෙනු සිදු විය. මෙම ශාලාව රු. 400 000 කට කුලියට දෙනු ලබන අතර ඉන් 25% ක් ශාලාව වෙන් කරන අවස්ථාවේ දී ද, ඉතිරිය විවාහ මංගල උත්සවයෙන් පසුව සතියක් ඇතුළත ද ගෙවිය යුතු වේ.

දිනය	ගනුදෙනුව	වටිනාකම (රු.)
2016.04.02	2016.03.28 දින පැවති විවාහ උත්සවය සඳහා ලද ඉතිරි මුදල	300 000
2016.04.05	2016.04.27 දින පැවැත්වීමට නියමිත විවාහ උත්සවය සඳහා ලද අත්තිකාරම	100 000
2016.04.15	2016.05.10 දින පැවැත්වීමට නියමිත විවාහ උත්සවය සඳහා ලද අත්තිකාරම	100 000
2016.04.30	2016 අප්‍රේල් මාසය සඳහා දරන ලද මෙහෙයුම් වියදම්	330 000

2016 අප්‍රේල් මාසය සඳහා ආදායම හා ලාභය/(අලාභය) සහ 2016.04.30 දිනට ලැබිය යුතු දෑ කොපමණ ද?

	ආදායම (රු.)	ලාභය/(අලාභය) (රු.)	ලැබිය යුතු දෑ (රු.)
(1)	200 000	(130 000)	600 000
(2)	400 000	70 000	300 000
(3)	500 000	170 000	600 000
(4)	700 000	370 000	300 000
(5)	800 000	470 000	600 000 (.....)

● **ප්‍රශ්න අංක 10 සහ 11 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පාසලක ආදි ශිෂ්‍ය සංගමයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

විස්තරය	වටිනාකම (රු.'000)
සාමාජික මුදල් ලැබීම් (මෙයින් 1/4 ක්, 2015.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ වේ.)	360
ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම සඳහා ලද පරිත්‍යාග	500
ස්ථාවර තැන්පතුව මත උපයන ලද පොලී ආදායම	50
මුළු වියදම්	300

අතිරේක තොරතුරු:

- සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 4 000 කි. 2016.03.31 දිනට සංගමයේ සාමාජිකයන් 100 ක් විය.
- පරිත්‍යාග, ලද වර්ෂයෙන් ආරම්භ වී වර්ෂ 5 ක කාලයක් තුළ දී, ආදායම ලෙස හඳුනාගැනීම සංගමයේ ප්‍රතිපත්තිය වේ.
- ස්ථාවර තැන්පතුව මත පොලී 2016.05.31 දින එය කල්පිරීමේ දී ලැබෙනු ඇත.
- සියලු වියදම් මුදලින් ගෙවා ඇත.
- 2015.03.31 දිනට මුදල් ශේෂය රු. 150 000 කි.

10. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය කොපමණ ද?

(1) රු. 120 000 (2) රු. 210 000 (3) රු. 250 000 (4) රු. 520 000 (5) රු. 650 000 (.....)

11. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ශේෂයේ **ශුද්ධ වැඩිවීම** කොපමණ ද?

(1) රු. 470 000 (2) රු. 520 000 (3) රු. 560 000 (4) රු. 610 000 (5) රු. 860 000 (.....)

12. එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක් වන සීමිත අජිත් පොදු සමාගම 2015.04.01 දින රු. 4 140 000 කට යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී. මෙහි VAT සඳහා ගෙවූ රු. 540 000 ක් අඩංගු වේ. මෙම යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වර්ෂ 5 ක් වන අතර එයට සුන්බුන් අගයක් නොමැත.

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනට යන්ත්‍රයේ ධාරණ වටිනාකම කොපමණ ද?

(1) රු. 2 448 000 (2) රු. 2 880 000 (3) රු. 3 312 000 (4) රු. 3 600 000 (5) රු. 4 140 000 (.....)

13. හවුල් ව්‍යාපාරයකට අදාළ ව පහත කුමන ප්‍රකාශය **නිවැරදි** වේ ද?

(1) හවුල් ව්‍යාපාරයක හිමිකම නිරූපණය කරනු ලබන්නේ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂයන් සහ වෙනත් සංචිත ඇත්නම් ඒවායේ ද එකතුවෙනි.

(2) 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතෙහි 24 වන වගන්තියට අනුව හවුල්කරුවකු වේතනයකට හිමිකම් ලබනුයේ හවුල් ව්‍යාපාරයට යම් සේවාවක් සැපයූ විට පමණි.

(3) 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතෙහි 24 වන වගන්තියට අනුව හවුල්කරුවන් අතර ලාභාලාභ බෙදාහරිනු ලබන්නේ ඔවුන් හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනයට දායක වී ඇති අනුපාතයට ය.

(4) හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබන්නේ හවුල්කරුවකු ඇතුළත් වූ විට දී හෝ විශ්‍රාම ගිය විට දී පමණි.

(5) හවුල්කරුවකු ඇතුළත් කරගත හැකි වන්නේ හෝ විශ්‍රාම යා හැකි වන්නේ මූල්‍ය වර්ෂයක පළමුවන හෝ අවසාන දිනයේ දී පමණි. (.....)

14. LKAS 2 (තොග) ප්‍රමිතයේ නිර්වචනයට අනුව තොග ලෙස හඳුනාගත හැකි වන්නේ පහත දෑ අතුරෙන් කුමක් ද?

A - සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී විකිණීම සඳහා පවත්වා ගනු ලබන භාණ්ඩ

B - සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී විකිණීම සඳහා නිෂ්පාදනය වෙමින් පවතින අයිතම

C - නිෂ්පාදන ක්‍රියාවලියේ දී හෝ සේවා සැපයීමේ දී භාවිත කිරීමට ඇති ද්‍රව්‍ය සහ සැපයුම්

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (.....)

15. පහත තොරතුරු සීමිත රබිත පොදු සමාගමේ මෝටර් රථ හා බැඳේ.

විස්තරය	**රු.'000**
2015.04.01 දිනට ධාරණ වටිනාකම	6 500
2015.09.30 දින විකුණූ මෝටර් රථය මත ඇති වූ අලාභය	150
2016.01.01 දින නව මෝටර් රථයක් අත්පත් කර ගැනීම	4 000

වර්ෂය ආරම්භයේ දී පැවති සියලු මෝටර් රථ 2010.04.01 දින මිල දී ගෙන ඇත. වර්ෂය තුළ දී විකුණූ මෝටර් රථය රු. 3 000 000 ක පිරිවැයකට මිල දී ගෙන ඇත. මෝටර් රථ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ක්ෂය සහ විකුණන ලද මෝටර් රථයේ විකුණුම් වටිනාකම වනුයේ:

	ක්ෂය (රු.'000)	**විකුණුම් වටිනාකම (රු.'000)**
(1)	650	1 500
(2)	1 000	1 350
(3)	1 100	1 350
(4)	1 100	1 200
(5)	1 250	1 200 (.....)

16. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මානෙල් පොදු සමාගමේ සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත පරිදි වේ:

විස්තරය	**රු.'000**
දළ ලාභය	280
වියදම් (රු. 20 000 ක ක්ෂය සහ රු. 10 000 ක කාර්යාලීය උපකරණ විකුණුම් මත අලාභය ද ඇතුළු ව)	100
ආදායම් බදු වියදම	80
වර්ෂය සඳහා ලාභය	100

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී පහත අයිතමයන්ගේ ශේෂයන් පහත පරිදි **වැඩි වී** ඇත:

විස්තරය	**රු.'000**
තොගය	80
වෙළෙඳ ලැබිය යුතු දෑ	120
වෙළෙඳ ගෙවිය යුතු දෑ	130

වර්ෂය තුළ දී ගෙවූ ආදායම් බදු රු. 50 000 කි.

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී මෙහෙයුම් කටයුතු තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

(1) රු. 10 000 (2) රු. 90 000 (3) රු. 150 000 (4) රු. 180 000 (5) රු. 230 000 (.....)

17. සීමිත ඉසුරු පොදු සමාගමේ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂකවරු විසින් 2016.06.15 දින අනුමත කරන ලදී. 2016.03.31 දින සිට 2016.06.15 දක්වා කාලයේ දී පහත සිද්ධීන් සමාගමේ සිදු විය.

A - 2016.04.15 දින සිට ව්‍යාපාරයේ කොටසක් වසා දැමීමේ සැලැස්මක් නිවේදනය කරන ලද අතර, මෙමගින් වාර්ෂිකව රු. 600 000 ක් ඉතිරි කිරීමට අපේක්ෂා කෙරේ.

B - රු. 1 000 000 ක අලාභයක් ජනනය කරමින් 2016.04.20 දින ප්‍රධාන නිෂ්පාදන පිරියතයක් ගින්නකින් විනාශ විය.

C - 2016.04.30 දින සිදු කළ ණයට විකුණුම් නිසා ඇති වූ රු. 750 000 ක ශේෂයක් සහිත ණයගැතියකු 2016.05.30 දින බුන්වත් විය.

D - 2016.06.15 දින සාමාන්‍ය කොටස්හිමියන්ට රු. 300 000 ක අවසාන ලාභාංශයක් පැහැදිලි කිරීම

LKAS 10 (වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉහත කුමන සිදුවීම් **නොගළපන සිද්ධීන්** ලෙස සලකනු ලබයි ද?

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (.....)

- **ප්‍රශ්න අංක 18, 19 සහ 20 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත නාමල් පොදු සමාගමට අදාළ වේ:

විස්තරය	**රු.'000**
විකුණුම්	1 200
විකුණුම් පිරිවැය	600
මෙහෙයුම් වියදම්	300
මෝටර් රථයක් විකිණීම මත ලාභය	80
සාමාන්‍ය කොටස්හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ	100
ප්‍රත්‍යාගණන හිඟය - කාර්යාලීය උපකරණ	120
ප්‍රත්‍යාගණන අතිරික්තය - ගොඩනැගිලි	180

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාලීය උපකරණ ප්‍රත්‍යාගණනය මත රු. 90 000 ක අතිරික්තයක් හඳුනාගෙන තිබුණි. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ප්‍රථම වතාවට ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර ඇත.

18. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනා ගන්නා ලද මුළු ආදායම සහ මුළු වියදම කොපමණ ද?

	මුළු ආදායම (රු.'000)	**මුළු වියදම (රු.'000)**
(1)	1 280	900
(2)	1 340	900
(3)	1 380	1 020
(4)	1 460	1 020
(5)	1 460	1 120

(.....)

19. LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගන්නා ලද ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම කොපමණ ද?

	ලාභය (රු.'000)	**වෙනත් විස්තීරණ ආදායම (රු.'000)**
(1)	160	180
(2)	250	90
(3)	260	180
(4)	350	90
(5)	380	60

(.....)

20. LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම සහ රඳවාගත් ඉපැයුම් කොපමණ ද?

	මුළු විස්තීරණ ආදායම (රු.'000)	**රඳවාගත් ඉපැයුම් (රු.'000)**
(1)	340	160
(2)	340	250
(3)	440	250
(4)	440	260
(5)	440	280

(.....)

21. වෙළෙඳ සමාගමක දළ ලාභ අනුපාතය ස්ථාවරව තිබිය දී, පසුගිය වර්ෂය හා සැසඳීමේ දී ප්‍රවර්තන වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය **අඩුවීමට** පහත කුමන දෑ බලපානු ලබයි ද?

A - ප්‍රවර්තන වර්ෂයේ අවසාන තොගයේ ශුද්ධ උපලබ්ධි අගය එහි පිරිවැයට වඩා අඩු වීම

B - පොලී ආදායම අඩු වීම

C - ගොඩනැගිලි ප්‍රථම වරට හිඟයකට ප්‍රත්‍යාගණනය කිරීම

D - සාමාන්‍ය කොටස්හිමියන්ට අතුරු ලාභාංශයක් ගෙවීම

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A, B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (.....)

22. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක ආදායම් ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

විකුණුම්	රු.	4 000 000
වර්ෂයේ ලාභය	රු.	200 000
පොලී වියදම්	රු.	60 000
ආදායම් බදු වියදම	රු.	40 000

2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය කොපමණ ද?

	ශුද්ධ ලාභ අනුපාතය (%)	**පොලී ආවරණ අනුපාතය (වාර)**
(1)	5	3.3
(2)	5	5
(3)	6	4
(4)	6	5
(5)	7.5	4

(.....)

23. පිරිවැය වර්ගීකරණයට අදාළ ව පහත කුමන ප්‍රකාශය **නිවැරදි** වේ ද?

(1) නිෂ්පාදිත පිරිවැය සමන්විත වන්නේ සෘජු පිරිවැයෙන් පමණි.
(2) සියලු සෘජු පිරිවැය, විචල්‍ය පිරිවැය වේ.
(3) යන්ත්‍ර ක්ෂය පාලනය කළ හැකි පිරිවැයක් ලෙස සලකනු ලබයි.
(4) පිරිවැය, හැසිරීම මත ප්‍රධාන වශයෙන් විචල්‍ය සහ ස්ථාවර ලෙස වර්ග කරනු ලැබේ.
(5) තොග මැනීම සඳහා පිරිවැය, අදාළ සහ අදාළ නොවන ලෙස වර්ග කරනු ලැබේ. (.....)

● **ප්‍රශ්න අංක 24 සහ 25 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් භාණ්ඩ නිෂ්පාදනය සඳහා 'A' අමුද්‍රව්‍ය යොදා ගනී. මෙම අමුද්‍රව්‍යයේ ඇණවුම්ක පිරිවැය රු. 250 ක් වන අතර එහි වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැය ඒකකයකට රු. 100 කි. 'A' අමුද්‍රව්‍යයෙහි යළි ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා සමාගම ආර්ථික ඇණවුම් ප්‍රමාණ (EOQ) ආකෘතිය භාවිත කරයි. පහත තොරතුරු 'A' අමුද්‍රව්‍යයට අදාළ වේ:

උපරිම පරිභෝජනය	සතියකට ඒකක	750
අවම පරිභෝජනය	සතියකට ඒකක	250
ආර්ථික ඇණවුම් ප්‍රමාණය	ඒකක	1 000
පොරොත්තු කාලය	සති	3 (අවම) – 5 (උපරිම)

24. 'A' අමුද්‍රව්‍යයෙහි උපරිම තොග මට්ටම කොපමණ ද?

(1) ඒකක 1 750 (2) ඒකක 2 750 (3) ඒකක 3 500 (4) ඒකක 3 750 (5) ඒකක 4 000 (.....)

25. 'A' අමුද්‍රව්‍යයෙහි වාර්ෂික ඉල්ලුම කොපමණ ද?

(1) ඒකක 200 000 (2) ඒකක 400 000 (3) ඒකක 500 000 (4) ඒකක 1 250 000 (5) ඒකක 2 500 000

● **ප්‍රශ්න අංක 26 සහ 27 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

යන්ත්‍ර සහ නිමැවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ සේවා දෙපාර්තමේන්තුවක් වන ගබඩාවකින් සමන්විත සමාගමකට පහත තොරතුරු අදාළ වේ.

විස්තරය	**යන්ත්‍ර**	**නිමැවුම්**	**ගබඩාව**
අයවැයගත පොදු කාර්ය පිරිවැය	රු. 175 000	රු. 125 000	රු. 50 000
පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත	යන්ත්‍ර පැයකට රු. 20	ශ්‍රම පැයකට රු. 10	–

ගබඩාවේ මුළු පොදු කාර්ය පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක අතරේ සමානව නැවත විභජනය කෙරේ. සමාගම නිපදවනු ලබන 'X' භාණ්ඩයේ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා යන්ත්‍ර පැය 2 ක් සහ ශ්‍රම පැය 5 ක් අවශ්‍ය වේ.

26. යන්ත්‍ර සහ නිමැවුම් දෙපාර්තමේන්තුවල භාවිත කිරීමට අපේක්ෂිත යන්ත්‍ර පැය සහ ශ්‍රම පැය පිළිවෙළින් කොපමණ ද?

	යන්ත්‍ර පැය	**ශ්‍රම පැය**
(1)	8 750	12 500
(2)	10 000	15 000
(3)	10 000	10 000
(4)	17 500	6 250
(5)	20 000	7 500

(.....)

27. 'X' භාණ්ඩයේ ඇස්තමේන්තුගත ප්‍රාථමික පිරිවැය රු. 120 ක් නම්, එහි ඒකකයක නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

(1) රු. 140 (2) රු. 150 (3) රු. 160 (4) රු. 170 (5) රු. 210 (.....)

28. පිරිවැය-පරිමා-ලාභ (CVP) විශ්ලේෂණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **සත්‍ය** වේ ද?

A - සමච්ඡේදන ලක්ෂ්‍යයට පසුව උපයන ලද දායකය ලාභයක් ජනනය කරයි.
B - සමච්ඡේදන ලක්ෂ්‍යයේ දී මුළු දායකය මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.
C - සමච්ඡේදන ලක්ෂ්‍යයෙන් පසුව මුළු දායකය, මුළු ස්ථාවර පිරිවැය හා ලාභයේ එකතුවට සමාන වේ.
D - සමච්ඡේදන ලක්ෂ්‍යයට පෙර ස්ථාවර පිරිවැය මුළු දායකයට වඩා වැඩි වේ.

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (.....)

29. සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබයි. මෙම භාණ්ඩයේ ඒකකයක නිෂ්පාදන පිරිවැය රු. 200 ක් වන අතර ඉන් 75%ක් විචල්‍ය වේ. සමාගම වර්තමානයේ දී ඒකක 14 000 ක් නිෂ්පාදනය කරන අතර එහි දායක විකුණුම් අනුපාතය 50% කි. වර්තමාන ක්‍රියාකාරී මට්ටම ඒකක 16 000 දක්වා වැඩි වූ විට රු. 260 000 ක අතිරේක ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයක් දැරීමට සමාගමට සිදු වේ.

වර්තමාන ක්‍රියාකාරී මට්ටමේ දී සමච්ඡේදන ලක්ෂ්‍යය (රුපියල්වලින්) සහ ක්‍රියාකාරී මට්ටම ඒකක 16 000 දී ඒකකයක නිෂ්පාදන පිරිවැය:

	සමච්ඡේදන ලක්ෂ්‍යය (රු.'000)	**ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු.)**
(1)	1 400	200.00
(2)	1 400	210.00
(3)	1 400	216.25
(4)	4 200	140.00
(5)	4 200	210.00

(.....)

30. අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය **වැඩිවීමට** පහත කුමන දෑ හේතු වේ ද?

A - අපේක්ෂිත මුදල් ගලාඒම් වැඩි වීම
B - ආරම්භක ආයෝජනයේ පිරිවැය අඩු වීම
C - වත්කමේ සුන්බුන් අගය වැඩි වීම
D - අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය වැඩි වීම

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා D පමණි.
(4) A, B හා C පමණි. (5) A, B, C හා D යන සියල්ලම.

(.....)

2.1.3. I ප්‍රශ්න පත්‍රයේ අංක 01 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	5	16.	2
02.	2	17.	5
03.	5	18.	4
04.	2	19.	4
05.	1/5	20.	3
06.	1	21.	3
07.	3	22.	2
08.	1	23.	4
09.	2	24.	5
10.	3	25.	1
11.	3	26.	2
12.	2	27.	5
13.	1	28.	5
14.	5	29.	2
15.	5	30.	4

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **04** බැගින් මුළු ලකුණු **120**කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. පහත කාර්යන් කළමනාකරණ ගිණුම්කරණයේ විෂයපථය තුළට ඇතුළත් වන්නේ ද යන්න සඳහන් කරන්න.

කාර්යය	ඔව්/නැත
A - භාණ්ඩ මිල කිරීම සඳහා පිරිවැය තොරතුරු සැපයීම	:.....
B - පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම	:.....
C - දිගුකාලීන ආයෝජන ව්‍යාපෘති ඇගයීම	:.....
D - ගිණුම්කරණ අනුපාත මත ආයතනයක ලාභදායීත්වය විශ්ලේෂණය කිරීම	:.....

පිළිතුර

31. A - ඔව් (01)
B - නැත (01)
C - ඔව් (01)
D - ඔව් (01)

32. රු. 1 000 000 ක් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරමින් 2016.01.01 දින විශ්ව විසින් වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඔහු මෙම මුදලෙන් 90% ක් භාණ්ඩ මිල දී ගැනීමට වැය කළ අතර, ඒවා පිරිවැය මත 30% ක ලාභ ආන්තිකයක් සහිත ව විකුණන ලදී. 2016.03.31 දිනට ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් රු. 1 200 000 ක් විය. කාලච්ඡේදය තුළ දී අමතර ප්‍රාග්ධනය හඳුන්වා දී හෝ ගැනිලි සිදු කර නොමැත.

2016.03.31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා පහත දෑ ගණනය කරන්න.

(අ) ලාභය රු. ..... (ආ) මෙහෙයුම් වියදම් රු. .....

පිළිතුර

32. (අ) ලාභය - රු.200 000 (02)
(ආ) මෙහෙයුම් වියදම රු. 70 000 (02)

33. 2016.04.01 දින සමන් රු. 100 000 කට භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී. එදින ම එම භාණ්ඩ රු. 120 000 කට අත්පිට මුදලට විකුණන ලද අතර ඒ සඳහා රු. 5 000 ක විකුණුම් වියදම් දරන ලදී.

පහත ආකෘතිය භාවිත කරමින් ගිණුම්කරණ සමීකරණය තුළ මෙම ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** පෙන්වන්න.

වත්කම් (රු.) ..... = **වගකීම් (රු.)** ..... + **හිමිකම් (රු.)** .....

පිළිතුර

33. වත්කම් (රු) 115 000 (01) වගකීම් (රු) 100 000 (01) හිමිකම් (රු) 15 000 (02)

34. නිෂ්පාදන ආයතනයක ණයගැති පාලන ගිණුමේ ශේෂය **වැඩි වීමට**, **අඩු වීමට** හෝ **වෙනස් නොවීමට** පහත ගනුදෙනු හේතු වන්නේ ද යන්න සඳහන් කරන්න.

ගනුදෙනුව	වැඩිවේ/අඩුවේ/වෙනස් නොවේ
A - භාවිත කරන ලද යන්ත්‍ර ණයට විකිණීම	:.....
B - ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම	:.....
C - වර්ෂය තුළ දී බොල් ණය කපා හැරීම	:.....
D - වර්ෂය අවසානයේ දී අඩමාණ ණය සඳහා වෙන් කිරීම	:.....

පිළිතුර

34. A - වෙනස් නොවේ. (01)
B - අඩුවේ. (01)
C - අඩුවේ. (01)
D - වෙනස් නොවේ. (01)

35. 2016.01.01 දින සමාගමක් විසින් ලැයිස්තුගත මිල රු. 500 000 ක් වූ යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී. සැපයුම්කරු ගැනුම් මිල මත 10% ක වෙළෙඳ වට්ටමක් සහ ගෙවිය යුතු මුදල දින 30 ක් තුළ පියවුවහොත් 5% ක මුදල් වට්ටමක් දීමට එකඟ වී ඇත. සමාගම දින 30 තුළ දී ගෙවිය යුතු වටිනාකම පියවන ලදී.

පහත දෑ සඳහන් කරන්න:

(අ) යන්ත්‍රය අත්පත් කර ගැනීමේ පිරිවැය රු. :.....

(ආ) 2016.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ලද වට්ටම් සටහන් කිරීමට ජර්නල් සටහන:

.....

.....

පිළිතුර

35. (අ) රු. 450 000 (02)

(ආ) යන්ත්‍ර සැපයුම්කරුගේ ගිණුම හර රු. 22 500

ලද වට්ටම් ගිණුම රු. 22 500 (02)

36. 2016.03.31 දිනට සමාගමක බැංකු ශේෂය රු. 450 000 ක් විය. එය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ නොවී ය. මෙම ශේෂ සැසඳීමේ දී පහත දෑ හෙළිදරව් විය.

- ණයගැතියකු විසින් රු. 80 000 ක චෙක්පතක් බැංකුවේ සෘජුව තැන්පත් කර තිබුණි.
- බැංකුව විසින් කළ ස්ථාවර නියෝග ගෙවීම් රු. 40 000 ක් විය.
- බැංකුවේ තැන්පත් කරන ලද රු. 60 000 ක චෙක්පත අගරු වී ඇත.
- බැංකුවේ තැන්පත් කරන ලද රු. 20 000 ක චෙක්පත මෙතෙක් උපලබ්ධි වී නොමැත.
- රු. 30 000 ක නිකුත් කරන ලද චෙක්පත්, ගෙවීම සඳහා මෙතෙක් ඉදිරිපත් කර නොමැත.

2016.03.31 දිනට පහත දෑ ගණනය කරන්න:

(අ) සංශෝධිත බැංකු ශේෂය රු. ..... (ආ) බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. .....

පිළිතුර

36. (අ) රු. 430 000 (02)

(ආ) රු. 440 000 (02)

37. සමාගමක් හා බැඳි පහත එක් එක් අවස්ථාව **වඩාත් හොඳින්** විස්තර කරනුයේ කුමන ගිණුම්කරණ සංකල්පය ද යන්න සඳහන් කරන්න.

අවස්ථාව	ගිණුම්කරණ සංකල්පය
A - ඉඩමක සාධාරණ අගය වැඩි වුව ද එය අත්පත් කරගත් මිලට වාර්තා කිරීම	:.....
B - යන්ත්‍ර භාවිත කිරීමට අපේක්ෂිත කාලසීමාව තුළ දී ඒවායේ ක්ෂය හඳුනා ගැනීම	:.....
C - ගැනුම් මිල රු. 5 000 ට අඩු සියලු වත්කම්, වියදම් ලෙස හඳුනා ගැනීම	:.....
D - තොග තක්සේරු කිරීම සඳහා පෙර-පිවිසි-පෙර-පිට මිල ක්‍රමය අඛණ්ඩව භාවිත කිරීම	.

පිළිතුර

37. A - ඓතිහාසික පිරිවැය සංකල්පය (01)

B - ගැලපුම් සංකල්පය (අනු සීහුම්)/කාලච්ඡේද සංකල්පය (01)

C - ප්‍රමාණාත්මක බවේ සංකල්පය (සාපේක්ෂ වැදගත් බවේ) (01)

D - සංගතතා සංකල්පය (01)

38. පහත එක් එක් අයිතමය හඳුනාගනු ලබන්නේ කුමන මූල්‍ය ප්‍රකාශන මූලිකාංගයෙහි ද යන්න සඳහන් කරන්න.

අයිතමය	මූලිකාංගය
A - රඳවාගත් ඉපැයුම්	:.....
B - ලැබිය යුතු පොලී	:.....
C - කාර්යාල උපකරණ විකුණුම් මත අලාභය	:.....
D - වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන	:.....

පිළිතුර

38. A - හිමිකම් (01)
    B - වත්කම් (01)
    C - වියදම් (01)
    D - වගකීම් (01)

● **ප්‍රශ්න අංක 39 සහ 40 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ශක්ති, කල්ප සහ පවන් විසින් ලාභාලාභ පිළිවෙළින් 5:3:2 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන ගියහ. 2016.03.31 දින පවන් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලද අතර, එදිනට කීර්තිනාමය රු. 1 000 000 කට ඇස්තමේන්තු කරන ලදී. පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගැනීම හවුල් ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ. ලාභාලාභ සමසමව බෙදා ගනිමින් ශක්ති සහ කල්ප විසින් හවුල් ව්‍යාපාරය දිගටම පවත්වා ගන්නා ලදී. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් තුළ සටහන් කරන ලද ගනුදෙනුවල සාරාංශය පහත පරිදි වේ:

විස්තරය	**ශක්ති (රු.'000)**	**කල්ප (රු.'000)**	**පවන් (රු.'000)**
ලාභ කොටස	500	300	200
වේතන	400	400	400
ප්‍රාග්ධන පොලී	300	200	100
ගැනිලි	(40)	–	(20)
ගෙවූ වේතන	(400)	(400)	(400)

39. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල කීර්තිනාමය ගැළපීමට අදාළ ජර්නල් සටහන:

.....

.....

.....

පිළිතුර

39. (අ) ප්‍රාග්ධන ගිණුම - කල්ප හර රු. 200 000
    ප්‍රාග්ධන ගිණුම - පවන් බැර රු.200 000 } (04)

විකල්පය

	හර(රු.)	බැර(රු.)	
ප්‍රාග්ධන ගිණුම - ශක්ති	500 000		
ප්‍රාග්ධන ගිණුම - කල්ප	500 000		
ප්‍රාග්ධන ගිණුම - ශක්ති		500 000	(04)
ප්‍රාග්ධන ගිණුම - කල්ප		300 000	
ප්‍රාග්ධන ගිණුම - පවන්		200 000	

40. පහත සඳහන් දෑ ගණනය කරන්න:

(අ) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය රු. .....

(ආ) විසර්ජනය කළ මුළු ලාභය: ශක්තිට රු. ..... පවන්ට රු. .....

පිළිතුර

40. (අ) රු. 2 800 000 (02)

(ආ) ශක්ති රු. 1 200 000 (01)
    පවන් රු. 700 000 (01)

41. LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතයට අනුව සමාගමකට ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථා **දෙක** සඳහන් කරන්න.

(1) .....

(2) .....

පිළිතුර

41. (1) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් ඉල්ලා ඇති විටදී. (02)

(2) ව්‍යාපාරයෙහි මුල්‍ය තත්ත්වය, මූල්‍ය ප්‍රතිඵලය සහ මුදල් ප්‍රවාහ පිළිබඳව විශ්වසනීය සහ වඩාත් අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් ලබාදීම සඳහා (02)

42. ගනුදෙනුකරුවන් මිල දී ගන්නා භාණ්ඩ දෝෂ සහිත වූ විට එහි මිල ආපසු ගෙවීම විදුලි උපකරණ විකුණන වෙළෙඳසැලක ප්‍රතිපත්තිය වේ. කෙසේ වුව ද එවැනි නෛතික බැඳීමක් නොමැත. LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව මෙහි දී ප්‍රතිපාදනයක් හඳුනාගැනීමට සම්පූර්ණ කළ යුතු නිර්ණායක **තුන** සඳහන් කරන්න.

(1) .....

(2) .....

(3) .....

පිළිතුර

42. (1) අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් තිබීම. (නෛතික හෝ සම්මුතික)

(2) එම බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හා බැඳුනු සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලායාමේ භව්‍යතාවයක් තිබීම.

(3) බැඳීමට අදාල වටිනාකම පිළිබඳව විශ්වාසදායී ඇස්තමේන්තුවක් කළ හැකි වීම. (04)

43. LKAS 17 (කල්බදු) ප්‍රමිතයට අනුව කල්බද්දක්, මූල්‍ය කල්බද්දක් ලෙස වර්ග කිරීමට භාවිත කරන නිර්ණායක **දෙකක්** සඳහන් කරන්න.

(1) .....

(2) .....

පිළිතුර

43. (1) කල් බදු කාලසීමාව අවසානයේ දී වත්කමෙහි නීත්‍යානුකූල අයිතිය කල්බදු ගැණුම්කරුට පැවරීම.

(2) වත්කමෙහි සාධාරණ අගයට වඩා සැලකිය යුතු අඩු මිලකට ඉදිරියේ දී වත්කම මිලදී ගැනීමට අවස්ථාවක් කල්බදු ගැනුම්කරුට හිමි අතර කල්බදු ගැණුම්කරු විසින් එම අවස්ථාව භාවිතයට ගනු ඇති බවට කල්බද්ද ආරම්භයේදීම සාධාරණ ලෙස නිශ්චය කළ හැකි වීම.

(3) වත්කමෙහි අයිතිය කල්බදු ගැණුම්කරුට නොපැවරුන ද වත්කමේ ආර්ථික ජීව කාලයෙන් සැලකිය යුතු ප්‍රමාණයකට කල්බදු කාලසීමාව අදාළ වීම.

(4) කල්බද්ද ආරම්භයේ දී අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය අවම වශයෙන් වත්කමෙහි සාධාරණ අගය ආවරණය කිරීම.

(5) කල්බද්දට යටත් වත්කම සුවිශේෂී ස්වභාවයක් දරන විට එය ප්‍රධාන වෙනස් කිරීමකින් තොරව වෙනත් පාර්ශවයකට භාවිත කළ නොහැකි වීම.

(ඕනෑම නිර්ණායක 2ක් සඳහා ලකුණු 02 බැගින්) (04)

44. සමාගමක් නව යන්ත්‍රයක් රු. 5 500 000 කට මිල දී ගන්නා ලදී. මෙම මිල දී ගැනීමට අදාළ ව කරන ලද පහත ගෙවීම් LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව හඳුනාගනු ලබනුයේ යන්ත්‍රයේ ආරම්භක පිරිවැයෙහි ද, වියදම්වල ද යන්න අදාළ තීරුවෙහි '√' ලකුණක් යොදමින් දක්වන්න.

අයිතමය	වටිනාකම (රු.'000)	ආරම්භක පිරිවැය	වියදම්
A - යන්ත්‍ර ක්‍රියාකරු පුහුණු කිරීම	120	.....	.....
B - ස්ථාපිත කිරීම සහතික කළ ඉංජිනේරුවරයාගේ ගාස්තුව	12	.....	.....
C - යන්ත්‍රය අත්හදා බැලීම	220	.....	.....
D - උත්සවාකාරයෙන් යන්ත්‍රය විවෘත කිරීම	150	.....	.....

පිළිතුර

44.	ආරම්භක පිරිවැය	වියදම
A -	-	√ (01)
B -	√ (01)	-
C -	√ (01)	-
D -	-	√ (01)

45. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සමාගමකට අදාළ වේ.

- වර්ෂය තුළ දී රු. 250 000 ක් පිරිවැය වූ කාර්යාල උපකරණයක් රු. 50 000 ක ලාභයක් සහිතව විකුණන ලදී. විකුණූ දිනට මෙම වත්කමේ සමුච්චිත ක්ෂය රු. 120 000 ක් විය.
- 2015.04.01 දින පිරිවැය රු. 1 500 000 ක් වූ ඉඩමක් රු. 500 000 ක් අතැති මුදලින් ද, ඉතිරිය ඉඩම උකස් කර ලබා ගත් බැංකු ණයකින් ද ගෙවා මිල දී ගන්නා ලදී. 2016.03.31 දින මෙම ණය සඳහා රු. 100 000 ක පොලියක් ගෙවන ලදී.

ඉහත ගනුදෙනු තුළින් පැනනැගුනු මුදල් ප්‍රවාහයන් (වටිනාකම් සහිතව) සහ LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව මෙම මුදල් ප්‍රවාහයන්ගේ නිසි වර්ගීකරණයන් සඳහන් කරන්න.

	මුදල් ප්‍රවාහය	**වටිනාකම (රු.)**	**වර්ගීකරණය**
A -	.....	.....	.....
B -	.....	.....	.....
C -	.....	.....	.....
D -	.....	.....	.....

පිළිතුර

45.	මුදල් ප්‍රවාහය	වටිනාකම (රු)	වර්ගීකරණය	
A -	උපකරණ විකිණීමෙන් ලද මුදල්	180 000	ආයෝජන ක්‍රියාකාරකම්	(01)
B -	ඉඩම් මිලට ගැනීම	1 500 000/500 000	ආයෝජන ක්‍රියාකාරකම්	(01)
C -	බැංකු ණය මුදල්	1 000 000	මූල්‍ය ක්‍රියාකාරකම්	(01)
D -	ගෙවූ ණය පොලී	100 000	මූල්‍ය/මෙහෙයුම් ක්‍රියාකාරකම්	(01)

46. අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී පහත එක් එක් අනුපාතයන්ගේ **වැඩි වීම** සමාගමක ද්‍රවශීලතාවය වැඩි දියුණු වීමක් පෙන්නුම් කරන්නේ ද යන්න සඳහන් කරන්න.

අනුපාතය	**ද්‍රවශීලතාවය වැඩි දියුණු වීම (ඔව්/නැත)**
A - ණයගැති පිරිවැටුම	:.....
B - ණය එකතු කිරීමේ කාලය	:.....
C - තොග පිරිවැටුම	:.....
D - තොග රඳවාගැනීමේ කාලය	:.....

පිළිතුර

46. A - ඔව් (01)
B - නැත (01)
C - ඔව් (01)
D - නැත (01)

47. කම්කරු නිෂ්පාදනය කරන සමාගමක් විසින් පහත පිරිවැය දරන ලදී. මෙම පිරිවැය අයිතම, විචල්‍ය (V) හෝ ස්ථාවර (F) හෝ ලෙස වර්ග කර, ඒවා නිෂ්පාදිත පිරිවැයට ඇතුළත් වන්නේ ද යන්න දක්වන්න.

පිරිවැය	V/F	නිෂ්පාදිත පිරිවැය (ඔව්/නැත)
A - නිපදවන ලද කම්කරු ප්‍රමාණය මත සේවක වේතන	.....	.....
B - කම්කරුවලට අල්ලනු ලබන බොත්තම්වල පිරිවැය	.....	.....
C - කර්මාන්තශාලාව සඳහා රක්ෂණ වාරිකය	.....	.....
D - නිෂ්පාදන සුපරීක්ෂකවරුන්ගේ වැටුප්	.....	.....

පිළිතුර

47. V/F නිෂ්පාදිත පිරිවැය (ඔව්/නැත)

A - V ඔව්

B - V නැත

C - F ඔව්

D - F නැත (04)

(ඕනෑම නිවැරදි අයිතම 2 කට 1 බැගින්)

48. වෙළෙඳ සමාගමක් තොග නිකුත් කිරීම් මිල කිරීම සඳහා භාවිත සාමාන්‍ය ක්‍රමය යොදා ගනී. 2016 මාර්තු මාසයේ තොග අයිතමයකට අදාළ තොරතුරු පහත දී ඇත.

දිනය	විස්තරය	ප්‍රමාණය (ඒකක)	මිල (රු.)
2016.03.01	ශේෂය	1 000	10
2016.03.07	ගැනුම්	2 000	15
2016.03.14	ගැනුම්	4 000	11
2016.03.20	විකුණුම්	4 000	?

පහත දැ ගණනය කරන්න:

(අ) 2016 මාර්තු මාසයේ විකුණුම් පිරිවැය රු. ..... (ආ) 2016.03.31 දිනට තොගය රු. .....

පිළිතුර

48. (අ) රු.48 000 (02) (ආ) රු.36 000 (02)

49. සමාගමක් විසින් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කර අලෙවි කරනු ලබයි. පහත තොරතුරු එහි ඒකක 10 000 ක නිෂ්පාදන මට්ටමට අදාළ වේ.

ඒකකයක විකුණුම් මිල	රු. 90
ඒකකයක විචල්‍ය පිරිවැය	රු. 60
ස්ථාවර පිරිවැය	රු. 180 000

අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී වෙළෙඳපොළ වෙනස්වීම් හේතුවෙන් ඒකකයක විකුණුම් මිල සහ විචල්‍ය පිරිවැය පිළිවෙළින් 30% කින් සහ 20% කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පහත දැ ගණනය කරන්න:

අවස්ථාව	සමච්ඡේද ලක්ෂ්‍යය (ඒකක)	ආරක්ෂිත ආන්තිකය (ඒකක)
(අ) වෙළෙඳපොළ තත්ත්වය වෙනස් වීමට පෙර	.....	.....
(ආ) වෙළෙඳපොළ තත්ත්වය වෙනස් වීමට පසු	.....	.....

පිළිතුර

49.

	සමච්ඡේදන ලක්ෂ්‍යය (ඒකක)	ආරක්ෂිත අන්තිකය (ඒකක)
(අ)	6 000 (01)	4 000 (01)
(ආ)	4 000 (01)	6 000 (01)

50. සමාගමක් විසින් රු. 2 400 000 කට යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. එහි ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5 ක් සහ රු. 600 000 ක් වේ. ක්ෂය වෙන්කිරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිත කරනු ලබයි. මෙම යන්ත්‍රයෙන් රු. 600 000 ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් සෑම වර්ෂයක දී ම අපේක්ෂා කෙරේ.

පහත දැ ගණනය කරන්න:

(අ) පිළිගෙවුම් කාලය (වසර) .....

(ආ) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය-සාමාන්‍ය ආයෝජනය මත පදනම්ව (%) .....

පිළිතුර

50. (අ) වසර 4 (02) (ආ) 16% (02)

2.1.5 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා:

I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ



මූල්‍ය ගිණුම්කරණය පිළිබඳ මූලික දැනුම, ගිණුම්කරණ සංකල්ප, පිරිවැය වර්ගීකරණය, දේපල පිරියත හා උපකරණවල ආරම්භක පිරිවැය හඳුනාගැනීම පිළිබඳ ව පිළිවෙළින් ඇතුළත් කර තිබූ ප්‍රශ්න අංක 1, 2, 23 හා 44 යන ප්‍රශ්න සඳහා අපේක්ෂකයින්ගෙන් 75%කට වඩා වැඩි ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සැපයීමට සමත් වී ඇති බව ඉහත ප්‍රස්තාරයට අනුව පෙනී යයි.

එමෙන්ම ගිණුම්කරණ ක්‍රියාවලිය, කළමනාකරණ ගිණුම්කරණයේ විෂයය පථයට ඇතුළත් වන කාර්යයන්, ගිණුම්කරණ සමීකරණය, ණයගැති පාලන ගිණුමේ ගනුදෙනු සටහන් කිරීම, මූල්‍ය ගිණුම්කරණ අනුපාත සහ පිරිවැය වර්ගීකරණය පිළිබඳ ව දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ඇතුළත් කර තිබූ ප්‍රශ්න අංක 5, 31, 33, 34, 46, 47 යන ප්‍රශ්නවලට ද අපේක්ෂකයින්ගෙන් බහුතරයක් 65%-74% අතර ප්‍රමාණයක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

ගිණුම්කරණ සංකල්ප, මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුව, උපචිත සංකල්පයට අදාළ ගැලපීම්, සේවක අර්ථසාධක අරමුදල් ගැලපීම, VAT ගැලපීම, හවුල් ව්‍යාපාර සම්බන්ධ මූලික දැනුම, LKAS 02 (තොග), පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය සහ බැංකු සැසඳුම් ප්‍රකාශය පිළිබඳ ව දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ඇතුළත් කර තිබූ ප්‍රශ්න අංක 4, 6, 7, 12, 13, 14, 26, 27, 36 යන ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින්ගෙන් 50%-64% දක්වා ප්‍රමාණයක් පමණි.

ප්‍රශ්න අංක 8, 9, 10, 11, 16, 18, 20, 21, 22, 24, 25, 28, 29, 30, 32, 35, 37, 40, 45, 48, 49 යන ප්‍රශ්න සඳහා නිවැරදි ව පිළිතුරු සපයා තිබුනේ අපේක්ෂකයින්ගෙන් සාපේක්ෂව සුළු පිරිසකි. එම ප්‍රතිශතය 30%-49% අතර වේ. එම ප්‍රශ්නවලින් පරීක්ෂා කිරීමට උත්සාහ කර ඇත්තේ, වැරදි නිවැරදි කිරීම, ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ගිණුම්, LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) LKAS 01 අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, මූල්‍ය ගිණුම්කරණ අනුපාත, ද්‍රව්‍ය පිරිවැය, පිරිවැය-පරිමා-ලාභ විශ්ලේෂණය, ප්‍රාග්ධන ආයෝජන තීරණ, ශුද්ධ වත්කම් පදනම මත ලාභය සෙවීම, මුදල් වට්ටම් හා වෙළෙඳ වට්ටම් පිළිබඳ අවබෝධය, ගිණුම්කරණ සංකල්ප යොදා ගැනීම සහ හවුල් ව්‍යාපාර ගිණුම්කරණය ආදිය පිළිබඳ දැනුම සහ අවබෝධයයි.

ප්‍රශ්න අංක 15, 17, 19, 41, 42, 43, 50 යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් ඉතා සුළු පිරිසක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 30%කට වඩා අඩු ප්‍රමාණයකි. මෙම ප්‍රශ්නවලින් පරීක්ෂා කිරීමට උත්සාහ කර ඇත්තේ දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම, ඉවත් කිරීම හා ක්ෂය සම්බන්ධ ගැටළු, LKAS 10 (වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්) LKAS 01ට අනුව කාලච්ඡේදයේ ලාභය හා වෙනත් විස්තීරණ ආදායම හඳුනා ගැනීම, LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) LKAS 37 (ප්‍රතිපාදන අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම්, LKAS 17 (කල්බදු) සහ ප්‍රාග්ධන ආයෝජන තීරණ පිළිබඳ දැනුම සහ අවබෝධය වේ.

ඒ අනුව 1 වන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී සමස්තයක් ලෙස ගිණුම්කරණ ප්‍රමිත සම්බන්ධ අවබෝධය දුර්වල මට්ටමක් පැවැති අතර, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඒ සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුවේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඉහත ප්‍රතිශත සැලකිල්ලට ගෙන නිවැරදි පිළිතුරු සැපයීමට දුර්වලතා දක්වන ලද මාතෘකා පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීම යෝග්‍ය බවත්, ප්‍රායෝගික මට්ටමේ නිපුණතා පාදක කරගෙන අදාළ ගැටළු හා පිළිතුරු සැකච්ඡා කිරීම වඩාත් ප්‍රයෝජනවත් විය හැකි බවත් කිව හැකිය.

2.1.6 I වන ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ප්‍රතිශතය					
		1	2	3	4	5	කිසිදු පිළිතුරක් සපයා නොමැත
1	5	1.03	1.03	2.17	1.17	**95.00**	0.13
2	2	5.13	**78.13**	2.97	12.00	2.00	0.34
3	5	4.80	4.80	8.00	19.03	62.77	0.60
4	2	6.80	**49.93**	13.53	20.80	8.03	0.91
5	1 සහ 5	**25.27**	3.87	10.30	14.07	46.17	0.32
6	1	**53.20**	14.00	19.50	9.40	2.83	1.07
7	3	16.77	9.40	**55.80**	13.47	3.00	1.56
8	1	**44.30**	8.43	12.37	7.40	26.63	0.87
9	2	7.53	**44.50**	29.53	6.53	10.77	1.14
10	3	7.60	17.83	**47.23**	15.93	9.80	1.61
11	3	14.73	15.27	**35.40**	24.20	8.07	2.33
12	2	2.43	**54.57**	14.57	22.47	4.97	0.99
13	1	**50.50**	4.77	13.87	26.57	3.60	0.69
14	5	6.77	18.67	12.43	4.43	**57.10**	0.60
15	5	17.67	9.47	24.37	20.30	**26.47**	1.72
16	2	12.83	**43.73**	11.77	16.77	13.37	1.53
17	5	16.77	18.40	22.63	12.37	**28.57**	1.26
18	4	23.93	7.07	11.47	**40.20**	16.40	0.93
19	4	7.53	9.03	24.57	**25.97**	31.73	1.17
20	3	10.57	11.70	**35.37**	18.30	22.87	1.19
21	3	17.50	29.03	**33.03**	10.57	9.00	0.87
22	2	27.13	**39.50**	11.27	15.27	5.43	1.40
23	4	2.27	10.90	2.60	**79.97**	3.63	0.63
24	5	9.70	12.10	8.83	19.60	**48.37**	1.40
25	1	**48.17**	13.43	13.87	12.47	10.23	1.83
26	2	20.17	**52.37**	6.10	10.03	10.27	1.06
27	5	5.90	13.50	14.20	10.53	**54.27**	1.60
28	5	19.57	13.47	21.87	11.03	**32.60**	1.46
29	2	9.33	**44.00**	20.63	11.37	11.50	3.17
30	4	13.60	14.30	14.30	**31.73**	23.30	2.77

වගුව 01

ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු ලෙස එක් එක් වරණය තෝරන ලද අයදුම්කරුවන්ගේ ප්‍රතිශත ඉහත වගු අංක 01හි දැක්වේ. එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය තෝරන ලද අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත. ඒ අතුරින් විශේෂතා හඳුනාගත් ප්‍රශ්න කිහිපයක් පිළිබඳ ව විග්‍රහයක් පහත දැක්වේ.

අපේක්ෂකයින් ප්‍රශ්න අංක 1, 2 හා 23 සඳහා සාර්ථකව පිළිතුරු සපයා ඇති බව නිරීක්ෂණය විය.

ගිණුම්කරණයේ අරමුණු පිළිබඳ දැනුම පිරික්සන ප්‍රශ්නයක් වන ප්‍රශ්න අංක 1 සඳහා නිවැරදි පිළිතුරු වන 4 වන වරණය සිය පිළිතුර ලෙස දක්වා ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 95%කි. පිරිවැය වර්ගීකරණය පිළිබඳ දැනුම පිරික්සන ප්‍රශ්නයක් වන ප්‍රශ්න අංක 23 සඳහා 80%ක් වූ අපේක්ෂකයින් නිවැරදි පිළිතුර වන 4 වන වරණය සිය පිළිතුරු ලෙස තෝරා ගෙන තිබුණි.

ප්‍රශ්න අංක 2 සඳහා නිවැරදි පිළිතුර වන 2 වන වරණය සිය පිළිතුර ලෙස දක්වා ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 78%කි. එය අඛණ්ඩ පැවැත්මේ සංකල්පයට අනුව වත්කම් වර්ගීකරණය කිරීම පිළිබඳ අවබෝධය පිරික්සන ප්‍රශ්නයක් විය.

ප්‍රශ්න අංක 5 සඳහා නිවැරදි පිළිතුරු වන 1 හා 5 වන වරණ සඳහා සිය පිළිතුරු ලෙස දක්වා ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 71%කි.

ප්‍රශ්න අංක 15, 19, 17, 30, 21, 28, 11, 20 සහ 22 යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින්ගෙන් 40%කට අඩු ප්‍රමාණයකි.

ඒ අතුරින් ප්‍රශ්න අංක 15 සඳහා නිවැරදි පිළිතුර වූ 5 වන වරණය තෝරාගෙන තිබූ ප්‍රතිශතය 26% කි. නිවැරදි ගැටළුව අවබෝධ කර නොගැනීම නිසා අපේක්ෂකයින්ගෙන් 24%ක් 3 වන වරණය ද, 20% ක් 4 වන වරණය ද 18%ක් 1 වන වරණය ද තෝරාගෙන ඇත. එහිදී තුන්වන වරණය තෝරාගත් අයදුම්කරුවන් විකුණූ මෝටර් රථයේ, විකුණූ වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම සැළකිල්ලට ගෙන නැති අතර ධාරණ අගය විකුණුම් මිල ලෙස ගෙන ඇත. සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සැපයීම දුර්වල වී ඇත්තේ ධාරණ වටිනාකමට දී ඇති මෝටර් රථ වටිනාකම පිරිවැයට හරවා ගැනීමට අපේක්ෂකයින් අපොහොසත් වීම නිසාය. එබැවින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ක්ෂය වෙන් කිරීම හා වත්කම් ඉවත් කිරීම සම්බන්ධ ගැලපීම් සහිත අභ්‍යාසවල සිසුන් යෙදවීම වැදගත් වනු ඇත.

ප්‍රශ්න අංක 19 සඳහා නිවැරදි පිළිතුර වූ 4 වන වරණය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 26% ක් පමණි. ඔවුන්ගෙන් 32%ක්ම සිය පිළිතුර ලෙස තෝරාගෙන ඇත්තේ 5 වන වරණයයි. තවත් 25%ක් සිය පිළිතුර ලෙස 3 වන වරණය තෝරාගෙන ඇත. 5 වන වරණය තෝරා ගැනීමට හේතුව වී ඇත්තේ කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණන ඌනතාවය වියදමක් ලෙස හඳුනා ගැනීමට අපොහොසත් වීමත්, කාර්යාල උපකරණ හිඟය සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අතිරික්තය හිලව් කොට වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනා ගැනීමත්ය.

ඒ අනුව වත්කම් කාන්ඩ දෙකක හිඟය හා අතිරික්තය එකිනෙකට හිලව් කළ නොහැකි බව සිසුන් අවබෝධ කරගෙන නොතිබුණ බව පෙනී යයි.

අපේක්ෂකයින් සිය පිළිතුරු ලෙස 3 වන වරණය තෝරා ගැනීමට හේතු වී ඇත්තේ ප්‍රත්‍යාගණය හිඟය කලින් වර්ෂයේ තිබූ අතිරික්තයට හිලව් නොකර ලාභය ගණනයේදී සම්පූර්ණයෙන්ම වියදමක් ලෙස හඳුනාගෙන තිබීමේ දෝෂයත්, ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අතිරික්තය පමණක් වෙනත් විස්තීරණ ආදායම් ලෙස හඳුනා ගැනීමේ දුර්වලතාවයත්ය. සමාගම් ගිණුම්කරණයේදී මුළු ආදායම, මුළු වියදම, ලාභය, වෙනත් විස්තීරණ ආදායම, මුළු විස්තීරණ ආදායම යන සංකල්ප පිළිබඳ ව වැඩි අවධානයක් යොමු වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වනු ඇත.

17 වන ප්‍රශ්නයේ නිවැරදි වරණය ලෙස අංක 5 තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 29%ක් පමණි. අපේක්ෂකයින් 23%ක් 3 වන වරණයද, තවත් 18%ක්, 2 වන වරණයද, 17%ක් 1 වන වරණය ද සිය පිළිතුරු ලෙස තෝරාගෙන තිබුණි. මෙම ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගැනීම හේතුවෙන් අපේක්ෂකයින් බොහෝ දෙනෙක් සිය පිළිතුර නිවැරදි නොවන වරණයන් අතර බෙදාහැර ඇත. මෙයට හේතු වශයෙන් දැක්විය හැක්කේ LKAS 10ට අනුව ගලපන හා නොගලපන සිදුවීම් හඳුනා ගැනීමට ඇති අවබෝධය දුර්වල මට්ටමක පැවතීමත්, දී ඇති දින පිළිබඳ ව ප්‍රමාණවත් සැලකිල්ලක් නොදැක්වීමත් විය හැකිය. මෙම ප්‍රමිතය පිළිබඳ පන්ති කාමරය තුළ සාකච්ඡා කිරීමේදී වාර්තා කරන කාලච්ඡේදයේ අවසාන දිනය, අධ්‍යක්ෂවරුන් විසින මූල්‍ය ප්‍රකාශන අනුමත කරන දිනය යන දින පිළිබඳ වැඩි අවබෝධයක් ලබාදීම ප්‍රයෝජනවත් වනු ඇත.

30 වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වූ 4 වන වරණය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 32% පමණි. තවත් 23%ක් සිය පිළිතුර ලෙස 5 වන වරණය තෝරාගෙන ඇති අතර, එය පිළිතුර ලෙස තෝරා ගැනීමට හේතුවී ඇත්තේ අපේක්ෂකයන් විසින් ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීමේදී යෙදවුම් ලෙස භාවිත කළයුතු අයිතම පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයක් නොතිබීමයි. විශේෂයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය වැඩිවීම මගින් මට්ටම් සාධකය ඉහළ යාම නිසා ශුද්ධ වර්තමාන අගය පහළ යන බව පිළිබඳ අවබෝධය මද බව පෙනී යයි. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මේ පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

21 වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වන 3 වන වරණය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 33% පමණක් වන අතර තවත් 29%ක් සිය පිළිතුර ලෙස 2 වන වරණය තෝරාගෙන ඇත. ඊට හේතුව වූ ප්‍රවර්තන වර්ෂයේ අවසාන තොගයේ ශුද්ධ උපලබ්ධි අගය අඩුවීම ලාභය අඩු වීමට බලපාන බව තේරුම් ගෙන නොතිබීමයි. ශුද්ධ උපලබ්ධි අගය අඩුවීම දළ ලාභයට බලපෑමක් ඇති නොකළත්, ශුද්ධ ලාභයට බලපාන බව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී නිදසුන් සහිත ව අවබෝධ කරවීම ප්‍රයෝජනවත් වනු ඇත.

28 වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වන වරණ අංක 5 තෝරාගෙන ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය ද 33%ක් පමණි. 22%ක් ම සිය පිළිතුර ලෙස 3 වන වරණය තෝරාගෙන ඇති අතර එම වරණය තෝරා ගැනීමේදී සමච්ඡේදන ලක්ෂ්‍යයේදී **"මුළු දායකය මුළු ස්ථාවර පිරිවැයට සමාන වන බව"** අපේක්ෂකයින් විසින් තේරුම් ගෙන නොමැති බව පෙන්නුම් කෙරේ.

11 වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වන 3 වන වරණය අපේක්ෂකයින් 35%ක් තෝරාගෙන ඇත. 24%ක් ම සිය පිළිතුර ලෙස තෝරාගෙන ඇත්තේ 4 වන වරණයයි. එයට හේතුව ස්ථාවර තැන්පතු මත උපයන ලද පොලී ආදායම, මුදල් ලැබීමක් ලෙස සලකා තිබීමයි. ප්‍රශ්නයට අදාළ උපදෙස් හා තොරතුරු හොඳින් කියවා, පසුව පිළිතුරු සැපයීමේ වැදගත්කම සිසුන් වෙත අවධාරණය කළ යුතුවේ.

ප්‍රශ්න අංක 20 සඳහා නිවැරදි පිළිතුර වූ 3 වන වරණය අපේක්ෂකයින්ගෙන් 35%ක් තෝරාගෙන ඇත. 23%ක් 5 වන වරණය සිය පිළිතුර ලෙස තෝරාගෙන ඇත. එම වරණය තෝරා ගැනීමට හේතුව විය හැක්කේ අයදුම්කරුවන් රඳවාගත් ඉපැයුම් ගණනයේදී කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණන හිඟය වියදමක් ලෙස නොසලකා ලාභය ගණනය කිරීමත්, එයින් ලාභාංශ අඩුකර රඳවාගත් ඉපැයුම් ගණනය කිරීමත්ය. මේ අනුව සමාගම් ගිණුම්කරණයේදී ප්‍රත්‍යාගණන ගැලපීම පිළිබඳ වැඩි අවබෝධයක් ලබාදීම වැදගත් වන බව අවධාරණය කළ හැක.

ප්‍රශ්න අංක 22 සඳහා නිවැරදි පිළිතුර වූ වරණ අංක 2 තෝරාගෙන තිබුණේ අපේක්ෂකයින්ගෙන් 40% කි. අපේක්ෂකයින්ගෙන් තවත් බහුතරයක් වූ 27%ක් සිය පිළිතුර ලෙස අංක 1 තෝරා තිබුණි. වරණ අංක 1 තේරීමට හේතු විය හැක්කේ බදු සහ පොලී එකතු නොකර කාලච්ඡේදයේ ලාභය පොලියෙන් බෙදා තිබීමයි. අනුපාත පිළිබඳ දැනුම සහ අවබෝධය ලබාදීම සඳහා එහි අන්තර්ගතය පිළිබඳ ව සෙවීමට සිසුන් යොමු වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වීම වැදගත් බව කිව හැකිය.

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය

ප්‍රශ්න අංකය	ලකුණු ලබාගත් ප්‍රතිශතය					
	ලකුණු 0	ලකුණු 1	ලකුණු 2	ලකුණු 3	ලකුණු 4	කිසිදු පිළිතුරක් සපයා නොමැත
31	0.47	8.1	17.6	39.63	33.6	0.6
32	40.87	-	33.1	-	16.5	9.53
33	9.17	21.27	6.27	9.27	50.5	3.53
34	3.6	7.67	17.9	39.2	31.17	0.47
35	44.63	-	25.2	-	24.7	5.47
36	32.67	-	10.73	-	49.27	7.33
37	18.2	28.2	22.33	15.3	12.57	3.4
38	31.83	6.27	9.37	16.27	28.97	7.3
39	43.27	-	-	-	45.43	11.3
40	38.93	1.3	23.03	3.23	20.53	12.97
41	43.43	4.83	14.57	10.9	12.03	14.23
42	41.37	9.53	15.97	0.6	13.07	19.47
43	48.87	-	20.5	-	11.17	19.47
44	3.97	3.57	16.83	21.67	50.93	3.03
45	28.33	3.6	11.5	17.03	22.97	16.57
46	5.93	6.37	26.9	19.43	39.7	1.67
47	2.1	6.3	24.07	47.43	18.47	1.63
48	54.53	-	6.77	-	25.97	12.73
49	27.33	6.73	15.3	1.37	34.87	14.4
50	36.9	-	47	-	3.6	12.5

වගුව 02

ඉහත වගු අංක 02 මගින් පෙන්නුම් කෙරෙන්නේ ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරයයි. ඒ අනුව ප්‍රශ්න අංක 31, 34 සහ 44 යන ප්‍රශ්න සඳහා අපේක්ෂකයින්ගෙන් 70%කට වැඩි ප්‍රමාණයක් සාර්ථක ව පිළිතුරු සපයා ඇත. ඒවායින් පිරික්සා ඇත්තේ කළමනාකරණ ගිණුම්කරණය, වෙළෙඳ වට්ටම් මුදල් වට්ටම්, දේපල පිරියත උපකරණවල පිරිවැය හඳුනා ගැනීම යනාදිය පිළිබඳ මූලික දැනුමයි. ප්‍රශ්න අංක 32, 35, 39, 41, 42, 43 සහ 48 සඳහා කිසිදු ලකුණක් නොලැබූ අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 60% ඉක්මවා ඇත.

ඒ අනුව න්‍යායාත්මක දැනුම භාවිතයට යොදා ගැනීමේ දුර්වලතාව, ගිණුම්කරණය පිළිබඳ තිබිය යුතු මූලික දැනුම නොසලකා හැරීම. ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ ව දැනුම සහ භාවිතය ප්‍රමාණවත් නොවීම සහ ප්‍රශ්න කියවා නිසි පරිදි අවබෝධ කරගෙන නොමැති වීම ආදිය කිසිදු ලකුණක් ලබා නොගැනීමට හේතු විය හැකිය.

ප්‍රශ්න අංක 32 සඳහා සමස්ත සාධන මට්ටම 34%කි. අපේක්ෂකයින්ගෙන් 41%ක් කිසිදු ලකුණක් ලබාගැනීමට අසමත් වී ඇති අතර, එයින් 10%ක් කිසිදු පිළිතුරක් සපයා නොතිබුණි. මෙය කොටස් දෙකකින් සමන්විත, ශුද්ධ වත්කම් ඇසුරෙන් ලාභය සහ වියදම් ලබාගත යුතු ප්‍රශ්නයකි. මෙහිදී බොහෝ අපේක්ෂකයින් ලාභය සොයා ගත්ත ද ඒ ඇසුරෙන් මෙහෙයුම් වියදම් සොයා ගැනීමට අපොහොසත් වී ඇති බව නිගමනය කළ හැකිය. ඒ අනුව ලකුණු 2 පමණක් ලබාගත් ප්‍රතිශතය 33%ක් වී ඇත. මෙහිදීද කිව හැක්කේ න්‍යායාත්මක කරුණු ප්‍රායෝගිකව යෙදීම පිළිබඳ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී වැඩි අවධානයක් යොමු කළ යුතු බවයි.

ප්‍රශ්න අංක 35 සඳහා කිසිදු ලකුණක් ලබා නොගත් ප්‍රතිශතය සඳහා පිළිතුරු සපයා ඇති මුළු ලකුණු ප්‍රමාණය වන ලකුණු 4ම ලබාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 25%ක් පමණි. වෙළෙඳ වට්ටම ගිණුම්ගත නොකරන බව පිළිබඳ මූලික ගිණුම්කරණ සිද්ධාන්තයන් අවබෝධය මදකම මෙයට හේතු විය හැකිය. එමෙන්ම ප්‍රශ්නය නිසි පරිදි කියවා අවබෝධ කර නොගෙන අදාළ ජ'නල් සටහන ලිවීමද, එලෙස ලකුණු අඩුවීමට තවත් එක් හේතුවක් විය හැකිය.

ප්‍රශ්න අංක 39 සඳහා කිසිදු ලකුණක් ලබාගත් නොගත් ප්‍රතිශතය 43%ක් වන අතර 11%ක් කිසිදු පිළිතුරක් සපයා නැත. හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ගැලපීම ගිණුම්ගත කිරීම පිළිබඳ ව මූලික අවබෝධය අපේක්ෂකයින්ගෙන් 50%කට අධික පිරිසකට නොමැති බව මෙයින් පෙනී යයි. කෙසේ වුවද අපේක්ෂකයින්ගෙන් 46%ක් මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ලබාගෙන ඇත.

ප්‍රශ්න අංක 41, 42 සහ 43 යන ප්‍රශ්නවලින් පරීක්ෂාවට ලක්කර ඇත්තේ ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ දැනුම සහ භාවිතයයි. ඒවායෙහි ලකුණු 0 (බින්දුව) ලබාගත් ප්‍රතිශතයන් පිළිවෙළින් 43%, 41% සහ 49%කි. ඉහත ප්‍රශ්න සඳහා කිසිදු පිළිතුරක් සපයා නොමැති ප්‍රතිශතය පිළිවෙළින් 14%, 20% සහ 20% කි. මෙයින් පෙනී යන්නේ ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ දැනුම සහ ඒවා යොදා ගන්නා අවස්ථා පිළිබඳ අවබෝධය මද බවයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඉහත කරුණු පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් බව අවධාරණය කළ හැකිය.

ප්‍රශ්න අංක 48 සඳහා සමස්ත සාධන මට්ටම 30%ක් පමණක් වන අතර, කිසිදු ලකුණක් ලබානොගත් ප්‍රතිශතය 55%ක් වන අතර, කිසිදු පිළිතුරක් සපයා නොමැති ප්‍රතිශතය 12.5%කි. ලකුණු 4ම ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 26%ක් පමණි. එම ප්‍රශ්නය තොග නිකුත් කිරීම් මිල කිරීම මගින් අවසන් තොගය සහ විකුණුම් පිරිවැය සෙවීම සම්බන්ධ ප්‍රශ්නයකි. හරිත සාමාන්‍ය මිල ක්‍රමය පිළිබඳ අවබෝධය අඩුවීමත්, තොග මිල කිරීම සහ විකුණුම් පිරිවැය අතර සම්බන්ධතාව පිළිබඳ අවබෝධය මදවීමත් මෙයට හේතු විය හැකි බව කිව හැකිය. එබැවින් න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත.

ප්‍රශ්න අංක 40 සඳහා කිසිදු ලකුණක් ලබා නොගත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 39%ක් අතර 13%ක් කිසිදු පිළිතුරක් සපයා නොමැත. මෙය හවුල් ව්‍යාපාර ලාභ විසර්ජනය සම්බන්ධ, කොටස් 2කින් යුත් ප්‍රශ්නයකි. හවුල් ව්‍යාපාරයක ලාභය යනු හවුල් වේතන, ප්‍රාග්ධන පොලී සහ අවසාන ලාභ කොටස් ලෙස බෙදා හරින ලද කොටස්වල එකතුව බව, අවබෝධය මදකම මෙයට හේතු විය හැකිය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී වැඩි අභ්‍යාස ප්‍රමාණයක් යොදා ගෙන ඉහත කරුණු අවධාරණය කිරීම වැදගත් වනු ඇත.

ප්‍රශ්න අංක 50 සඳහා අපේක්ෂකයින්ගේ සමස්ත සාධන මට්ටම 27%කි. (ප්‍රස්තාර අංක 05) කිසිදු ලකුණක් නොලැබූ අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 37%කි. මෙම ප්‍රශ්නයෙන් පිරික්සා ඇත්තේ ආයෝජනයක පිළිගෙවුම් කාලය සහ ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතයයි. මෙම කොටස් දෙක සඳහා ලකුණු 2 බැගින් හිමිවන අතර එක් කොටසක් නිවැරදි වීම මත ලකුණු 2 ලබාගත් ප්‍රතිශතය 47%කි. ඒ අනුව **ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය** ගණනය කිරීම පිළිබඳ දැනුම සහ භාවිතය මදවීම මෙයට හේතු වූ බව කිව හැකිය. උසස් පෙළ ගිණුම්කරණය විෂයය නිර්දේශයේ අවසන් මාතෘකාවක් වන **ප්‍රාග්ධන ආයෝජන තීරණ** පිළිබඳ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ප්‍රායෝගික අභ්‍යාස කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වනු ඇත.

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03 යි

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7කින් යුක්තය. පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර ඒ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි. සෙසු ප්‍රශ්න 5 න් 4 ක් තෝරා ගත යුතු අතර එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60කි. මුළු ලකුණු 100 කි.

අවසාන ලකුණු ගණනය කිරීම :

I පත්‍රය 100
II පත්‍රය 100
අවසාන ලකුණු 200 ÷ 2 = 100

* පිළිතුරු පත් ඇගයීමේ දී සෑම ප්‍රශ්නයකම ලකුණු දෙගුණ කර ලබා දෙනු ඇත.
ඒ අනුව අවසාන ලකුණු ගණනය කිරීම :

I පත්‍රය 200
II පත්‍රය 200
අවසාන ලකුණු 400 ÷ 4 = 100

2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 2, 3 සහ 4, ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.

II පත්‍රය

01 ප්‍රශ්නය

1. ලිපිද්‍රව්‍ය වෙළෙඳාමේ නියුතු සීමිත සුමේධ පොදු සමාගමේ 2016.03.31 දිනට ශේෂ පිරික්සුම් පහත දී ඇත. මෙය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සමාගමකි.

විස්තරය	හර (රු. '000)	බැර (රු. '000)
වැටුප්	1 000	
කුලී	540	
විදුලිය	120	
දුරකථන	75	
ගැනුම්	6 000	
VAT ගෙවීම්	600	
2015.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ	10 000	
2015.04.01 දිනට තොගය	1 200	
වෙළෙඳ ලැබිය යුතු දෑ	7 000	
බැංකුවේ ඇති මුදල්	730	
ප්‍රවර්තන වර්ෂය සඳහා ගෙවන ලද ආදායම් බදු	535	
විකුණුම්		12 000
VAT එකතු කිරීම්		1 320
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය		4 000
2015.04.01 දිනට රඳවාගත් ඉපැයුම්		2 327
ප්‍රත්‍යාගණන සංචිත - කාර්යාල උපකරණ		600
කල්බදු ණයහිමියෝ		2 353
පොදු සංචිත		1 200
2015.04.01 දිනට සමුච්චිත ක්ෂය - දේපළ, පිරියත සහ උපකරණ		4 000
	27 800	**27 800**

අතිරේක තොරතුරු:

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැලපීම් කළ යුතු වේ.

(i) වෙළෙඳ නියෝජිතයන්ට විකුණුම් මත ගෙවූ 2% ක කොමිස්, වැටුප් තුළ ඇතුළත් කර ඇත.

(ii) 2016 මාර්තු මාසය සඳහා රු. 15 000 ක විදුලි බිල මෙතෙක් ගෙවා නොමැත.

(iii) 2016 මාර්තු මාසය සඳහා රු. 18 000 ක දුරකථන ගාස්තු කලින් ගෙවා ඇත. කෙසේ වුව ද මාර්තු මාසය සඳහා බිල රු. 8 000 ක් විය.

(iv) අයිතම ක්‍රමය මත සමාගම තොග අගය කරයි. 2016.03.31 දිනට පැවති තොගය, ලිපිද්‍රව්‍ය අයිතම කාණ්ඩ තුනකින් සමන්විත විය. මෙදිනට ඒවායේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පහත පරිදි විය.

කාණ්ඩය	පිරිවැය (රු.'000)	ශුද්ධ උපලබ්ධි අගය (රු.'000)
A	520	600
B	300	250
C	280	300

(v) 2016.03.31 දිනට රු. 750 000 ක ශේෂයක් සහිත ණයගැතියකු බුන්වත් වී ඇති බව 2016.04.30 දින ප්‍රකාශයට පත් කරන ලදී. 2016.05.15 දින සමාගමේ අධ්‍යක්ෂකවරු විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

(vi) 2015.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ සහ ඒවායේ සමුච්චිත ක්ෂයවල සංයුතිය පහත පරිදි විය.

විස්තරය	පිරිවැය/වටිනාකම (රු.'000)	සමුච්චිත ක්ෂය (රු.'000)	ධාරණ වටිනාකම (රු.'000)
මෝටර් රථ (කල්බදු පදනමට) - පිරිවැයට	6 000	2 400	3 600
කාර්යාල උපකරණ - සාධාරණ අගයට	2 500	1 000	1 500
ලී බඩු සහ සවි කිරීම් - පිරිවැයට	1 500	600	900
එකතුව	**10 000**	**4 000**	**6 000**

සියලු ම වත්කම් (කල්බදු වත්කම් ද ඇතුළුව) 2013.04.01 දින අත්පත් කරගෙන ඇති අතර එදිනට ඒවායේ ඵලදායී ජීව කාලය වසර 5 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. ඒවා සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(vii) 2015.04.01 දින ලී බඩු සහ සවිකිරීම්වල ඉතිරි ඵලදායී ජීව කාලය වසර 6 ක් ලෙස සංශෝධනය කරන ලදී. තව ද 2016.03.31 දින කාර්යාල උපකරණ රු. 1 800 000 ක වෙළෙඳපොළ අගයට ප්‍රත්‍යාගණනය කරන ලදී.

(viii) මෝටර් රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිතයට ගන්නා අතර ඒවායේ කල්බදු කාලය වසර 5 කි. වාර්ෂික කල්බදු වාරිකය රු. 1 583 000 කි. ප්‍රවර්තන වර්ෂයේ කල්බදු වාරිකය ගෙවා ඇති අතර එය සම්පූර්ණයෙන්ම කල්බදු ණයහිමි ගිණුමට හර කර ඇත. මෙය සම්බන්ධ ව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත. කල්බදු පොලිය පහත පරිදි වේ.

වසර	පොලිය (රු.'000)
2013/14	600
2014/15	502
2015/16	394
2016/17	275
2017/18	144

(ix) 2016.03.31 දින සමාගම විසින් පොදු සංචිත ප්‍රාග්ධනිත කරමින් කොටසක් රු. 20 බැගින් සාමාන්‍ය කොටස් 40 000 ක් දැනට සිටින කොටස්කරුවන්ට නිකුත් කර ඇත. කෙසේ වුව ද මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් තබා නොමැත.

(x) ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බද්ද රු. 500 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

අවශ්‍යවන්නේ:

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සුමේධ පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(මුළු ලකුණු 20 යි)**

පිළිතුර

ප්‍රශ්න අංක 01

(1) සීමිත සුමේධ පොදු සමාගම

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

	සටහන්	(රු'000)	
විකුණුම්		12 000	(01)
විකුණුම් පිරිවැය	(01)	(6 100)	(03)
දළ ලාභය		(5 900)	(05)
බෙදාහැරීමේ පිරිවැය		(2 190)	(01)
පරිපාලන වියදම්	(01)	(2 150)	(01)
වෙනත් වියදම්	(01)	(50)	
මූල්‍ය පිරිවැය		(394)	(01)
බදු පෙර ලාභය	01	1 116	
ආදායම් බදු	(01)	(500)	
කාලච්ඡේදයේ ලාභය		616	
වෙනත් විස්තීරණ ආදායම්			
ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම		800	
මුළු විස්තීරණ ආදායම		1 416	

සටහන 01 :- බදු පෙර ලාභය ගණනය කර ඇත්තේ පහත වියදම් ද අඩු කිරීමෙන් පසුවය.

		රු' 000
තොග කපාහැරීම	(02)	50
ක්ෂය		1 850
කල්බදු පොලී		394

(ඕනෑම අයිතම දෙකකට ලකුණ 2 යි)
(ලකුණු 20)

පෙර වැඩ රු' 000				
විකුණුම් පිරිවැය			**විකුණුම් පිරිවැය**	
2015.04.01 තොගය	1 200		විකුණුම් කොමිස්	240 [01]
ගැනුම්	6 000	[01]	බොල් ණය	750 [01]
2016.03.31 තොගය	(1 100)		මෝට රථ ක්ෂය	1 200 [01]
	6 100			2 190
පරිපාලන වියදම්		[01]	**වෙනත් වියදම්**	[01]
වැටුප්	760	[01]	තොග කපා හැරීම	50
විදුලි ගාස්තු	135	[01]		
දුරකථන	65		**මූල්‍ය පිරිවැය**	[01]
කුලී	540	[01]	කල්බදු පොලී	394
ලී බඩු හා සවිකිරීම් ක්ෂය	150	[01]		
කාර්යාල උපකරණ ක්ෂය	500			
	2 150			

(2) සීමිත සුමේධ පොදු සමාගම

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය රු' 000

	ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්	ප්‍රත්‍යාගණන සංචිතය	පොදු සංචිතය	රඳවාගත් ඉපැයුම්	එකතුව
2015.04.01 දිනට ශේෂය	4 000	600	1 200	2 327	8 127
සංචිත ප්‍රාග්ධනිත කිරීම	800		(800)		
		(01)			
* **මුළු විස්තීරණ ආදායම**		(01) 800		(01) 616	1 416
2016.03.31 ශේෂය	4 800	1 400	400	2 943	9 543

(ලකුණු 03)

(3)

සීමිත සුමේධ පොදු සමාගම

2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (01)

	සටහන්	(රු'000)	(රු'000)	
ජංගම නොවන වත්කම්			(01)	
දේපළ, පිරියත හා උපකරණ	02		4 950	
ජංගම වත්කම්			(01)	
තොගය		1 050	(01)	
වෙළඳ ලැබිය යුතු දෑ		6 250	(01)	
ඉදිරියට ගෙවූ දුරකථන ගාස්තු		10	(01)	
ඉදිරියට ගෙවූ ආදායම් බදු		35	8 075	
මුදල් හා මුදල් සමාන දෑ		730	13 025	
මුළු වත්කම්				
හිමිකම්				
ප්‍රකාශිත ප්‍රාග්ධනය				
සාමාන්‍ය කොටස්			4 800	
සංචිත				
ප්‍රත්‍යාගණන සංචිතය		1 400		
පොදු සංචිතය	(02)	400		
රඳවාගත් ඉපැයුම්		2 943	4 743	
මුළු හිමිකම			9 543	(01)
			(01)	
ජංගම නොවන වගකීම්				
කල්බදු ණයහිමියෝ			(01) 1 439	
			(01)	
ජංගම වගකීම්				
කල්බදු ණයහිමියෝ		1 308		
උපචිත විදුලි ගාස්තු		15		
ගෙවිය යුතු VAT		720	2 043	
මුළු වගකීම් සහ හිමිකම			13 025	

සටහන 02 - දේපළ පිරියත හා උපකරණ (රු' 000)

පිරිවැය	මෝටර් රථ	කාර්යාල උපකරණ	ලීබඩු සහ සවි කිරීම්	එකතුව
2015.04.01 දිනට ශේෂය	6 000	2 500	1 500	10 000
ප්‍රත්‍යාගණනය		800 (01)		800
ප්‍රත්‍යාගණනය මත සමුච්චිත ක්ෂය මාරු කිරීම		(1 500) (01)		(1 500)
2016.03.31 දිනට ශේෂය	6 000	1 800	1 500	9 300
සමුච්චිත ක්ෂය				
2015.04.01 දිනට ශේෂය	2 400	1 000	600	4 000
කාලච්ඡේදයේ ක්ෂය	(02) 1 200	500	150	1 850
ප්‍රත්‍යාගණනය මත සමුච්චිත ක්ෂය මාරු කිරීම		(1 500) (01)		(1 500)
2016.03.31 දිනට ශේෂය	3 600	-	750	4 350
2016.03.31 දිනට ධාරණ වටිනාකම	2 400	1 800	750	4 950

වර්ෂය තුළ කාර්යාල උපකරණ රු.1 800 000කට ප්‍රත්‍යාගණනය කර රු.800 000ක අතිරික්තයක් ඇති වී ඇත.

(ලකුණු 17)
(මුළු ලකුණු 40)

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 x 2 = ලකුණු 40කි.
1 ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. ඉතා සුළු පිරිසක් හැර අනෙකුත් අපේක්ෂකයින් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 31ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 22%ක් වන අතර, අපේක්ෂකයින්ගෙන් 30%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10 හෝ ඊට වඩා අඩු ප්‍රමාණයකි. ලකුණු 20කට වඩා ලබාගත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 49%කි.



මෙම ප්‍රශ්නයේ අනුකොටස් 3ක් ඇති අතර අනු කොටස් තුනේම පහසුතාව 55%ට වඩා වැඩිය. පහසුතාව අඩුම අනු කොටස (3) වී ඇති අතර, එහි පහසුතාව 57%කි. වැඩිම පහසුතාව සහිත අනුකොටස (2) වී ඇති අතර, එහි පහසුතාවය 63%කි.

(1) කොටසේ පහසුතාව 58%ක් වන අතර, එයින් පිරික්සා ඇත්තේ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය සකස් කිරීමේ හැකියාවයි.මෙයට පිළිතුරු සැපයීමේදී දැකිය හැකි දුර්වලතා ලෙස ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව, අයිතම් ක්‍රමයට අවසාන තොග ගණනය කිරීමේ හැකියාව දුර්වල වීම, ගිණුම්කරණ ප්‍රමිත අංක 17ට අනුව, කාලච්ඡේදයට අදාළ කල්බදු පොලිය නිවැරදි ව හඳුනා නොග ැනීම, ගිණුම්කරණ ප්‍රමිත අංක 16ට අනුව වත්කම් ප්‍රත්‍යාගණනය පිළිබඳ ගිණුම් තැබීමේ අවබෝධය මද වීම ආදී කරුණු පෙන්වා දිය හැකිය. එම කරුණු අවධාරණය වන ලෙස ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

(2) කොටස මෙම ප්‍රශ්නයේ වැඩිම පහසුතාව දක්වා ඇති කොටසයි. එහි පහසුතාවය 63%කි. මෙයින් පිරික්සා ඇත්තේ හිමිකම වෙනස්වීමේ ප්‍රකාශනය සකස් කිරීම පිළිබඳ අවබෝධයයි. මෙහිදී ආදායම් ප්‍රකාශනයේ, කාලච්ඡේදයේ ලාභය හා ප්‍රත්‍යාගණන අතිරික්තය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයට මාරු කිරීම පිළිබඳ අවබෝධය දුර්වල මට්ටමක තිබූ බව කිව හැකිය. ඒ පිළිබඳ ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමු වීම වැදගත් වනු ඇත.

(3) කොටසේ පහසුතාවය 57%ක් වන අතර, එමගින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කිරීම පිළිබඳ ව අවබෝධය පිරික්සා ඇත. ආදායම් බදු ගැලපීමේදී ඉදිරියට ගෙවූ ආදායම් බදු හඳුනාගෙන නොමැති බව පෙනේ. තවද කල්බදු ණයහිමියන් ජංගම හා ජංගම නොවන ලෙස හඳුනාගත්ත ද, එහි අගයන් නිවැරදි ව හඳුනා ගෙන නොමැතිවීම ද දුර්වලතාවයන් ලෙස දැක්විය හැකිය.

එමෙන්ම VAT, වගකීමක් ලෙස හඳුනා නොගැනීම හා එහි අගය නිවැරදි ව තක්සේරු නොකිරීම වැනි අපහසුතා දක්නට ලැබුණි.

එම කරුණු හොඳින් අවබෝධ වන පරිදි සැලකිය යුතු අභ්‍යාස ප්‍රමාණයක් යොදා ගෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියවලිය සංවිධානය කිරීම වැදගත් වනු ඇත.

02 ප්‍රශ්නය

2. **(අ)** ලාභාලාභ සම සමව බෙදා ගන්නා රංග සහ එරංග උපදේශන සේවා සපයන ව්‍යාපාරයක හවුල්කරුවන් වූහ. 2015.04.01 දින උදාර හවුල්කරුවකු ලෙස බඳවා ගන්නා ලදී. සංශෝධනය කරන ලද හවුල් ව්‍යාපාර ගිවිසුම පහත පරිදි වේ.

- රංග, එරංග සහ උදාර පිළිවෙළින් ලාභාලාභ 2:2:1 අනුපාතයට බෙදාගනු ලබයි.
- හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගන්නා අතර කීර්තිනාමයට අදාළ සියලු ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් සටහන් කරයි.
- හවුල්කරුවන් වර්ෂ අවසාන ප්‍රාග්ධන ශේෂ මත 10% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.
- එරංගට සහ උදාරට රු. 40 000 බැගින් මාසික වේතනයක් හිමි වේ.
- හවුල් ව්‍යාපාරයට ලබා දෙන ණය සඳහා හවුල්කරුවන් වාර්ෂික ව 8% ක පොලියකට හිමිකම් ලබයි.

2016.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි විය:

විස්තරය	හර (රු.'000)	බැර (රු.'000)
උපදේශන ආදායම්		8 600
උපදේශන වියදම්	3 500	
මෙහෙයුම් වියදම්	1 200	
එරංගට ගෙවූ වේතන	480	
2016.01.01 දින උදාර ලබා දුන් ණය		2 000
උදාරට ගෙවූ ණය පොලී	30	
2016.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ-ධාරණ වටිනාකමට	6 000	
දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය	1 800	
වෙනත් ආදායම්		100
බැංකුවේ ඇති මුදල්	290	
2015.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම් :- රංග		1 000
- එරංග		1 000
2015.04.01 දිනට ජංගම ගිණුම් :- රංග		200
- එරංග		100
උදාර රැගෙන ආ මුදල		300
	13 300	13 300

අතිරේක තොරතුරු:

(i) උදාර පහත දැ ප්‍රාග්ධනය ලෙස ගෙන එන ලදී:

	රු.'000
කාර්යාල උපකරණ	700
මුදල්	300

කෙසේ වුව ද උදාර ගෙන ආ මුදල පමණක් ගිණුම් පොත්වල සටහන් කර තිබුණි.

(ii) උදාර බඳවා ගන්නා අවස්ථාවේ දී හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 800 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.

(iii) දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය මත වාර්ෂික ව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(iv) 2016.01.01 දින හවුල් ව්‍යාපාරය සේවාදායකයකු වෙත මාසිකව රු. 100 000 ක ගාස්තුවකට උපදේශන සේවා සැපයීම සඳහා ගිවිසුමකට ඇතුළත් විය. මෙදින සේවාදායකයා රු. 500 000 ක් ගෙවූ අතර එය උපදේශන ආදායම් ලෙස සටහන් කර තිබුණි.

(v) 2016.03.31 දින හවුල් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ නොවී ය. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දැ අනාවරණය විය.

- බැංකුවේ සෘජුව තැන්පත් කරන ලද රු. 300 000 ක උපදේශන ආදායමක් ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.
- උපදේශන සේවාවක් වෙනුවෙන් රංගගේ බිරිඳගෙන් ලද රු. 50 000 ක චෙක්පතක් බැංකුවේ තැන්පත් කළ නමුත් මෙතෙක් උපලබ්ධි වී නොමැත. මෙය වෙනත් ආදායම් ලෙස සටහන් කර ඇත.
- බාහිර උපදේශකයන්ට නිකුත් කළ රු. 250 000 ක චෙක්පත් ගෙවීමට ඉදිරිපත් කර නොතිබුණි.
- එරංගගේ රු. 50 000 ක නිවාස ණය වාරිකය ස්ථාවර නියෝග මත හවුල් ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් ගෙවා ඇති මුත් ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

අවශ්‍යවන්නේ:

(1) 2016.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය සහ බැංකු සැසඳුම් ප්‍රකාශනය

(2) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (විසර්ජනයන් සහිතව)

(3) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්

(ලකුණු 10 යි)

පිළිතුර

ප්‍රශ්න අංක 02

02. (අ) (1) **සංශෝධිත මුදල් ශේෂය - රු.540 000** (02)

පෙරවැඩ		**රු**
බැංකු ශේෂය		290 000
උපදේශන ආදායම්	[01]	300 000
		590 000
අඩු කළා		
ස්ථාවර නියෝග මත ගෙවූ එරංගගේ ණය වාරිකය	[01]	(50 000)
		540 000

2016.03.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (රු' 000)

බැංකු ගිණුමට අනුව ශේෂය	(01)	540	
එකතු කලා -			
නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්		250	(01)
		790	
අඩු කලා -			
තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්		(50)	(01)
බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය		740	

(ලකුණු 05)

(2) රංග, එරංග සහ උදාර හවුල් ව්‍යාපාරය

2016.03.31 ක්ෂණෙන් අවසන් ව ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(රු'000)

ආදායම්			
උපදේශන ආදායම්			8 750 (02)
උපදේශන වියදම්			(3 500)
දළ ලාභය			5 250
වෙනත් ආදායම්			50 (01)
			5 300
වියදම්			
මෙහෙයුම් වියදම්		1 200	
ක්ෂයවීම්		1 870 (01)	
ණය පොළී		40 (01)	(3 110)
වර්ෂයේ ලාභය			2 190
ප්‍රාග්ධන පොළී -	රංග	118	
	එරංග	118 (01)	
	උදාර	64	(300)
වේතන -	එරංග	480	
	උදාර	480 (01)	(960)
ලාභ කොටස් -	රංග	372	
	එරංග	(01) 372	
	උදාර	186	(930)

(ලකුණු 08)

(2)

පෙරවැඩ	රු' 000	
උපදේශන ආදායම්	8 600	
සටහන් නොවූ ආදායම් (සෘජු තැන්පතු)	300	
ඉදිරියට ලද උපදේශන ආදායම්	(200)	02
වෙනත් ආදායම් ලෙස සටහන්වීම	50	
	8 750	

(ලකුණු 07)

(3)

ප්‍රාග්ධන ගිණුම්

	රංග	එරංග	උදාර		රංග	එරංග	උදාර	
කීර්තිනාමය	720	720	360	ශේෂය ඉ/ගෙ	1 000	1 000	-	
		(01)		මුදල්	-	(01) -	300	(01)
				කාර්යාල උපකරණ	-	-	700	
ශේෂය ප/ගෙ	1 180	1 180	640	කීර්තිනාමය	900	900	-	
	1 900	1 900	1 000		1 900	1 900	1 000	

ජංගම ගිණුම්

	රංග	එරංග	උදාර		රංග	එරංග	උදාර
ගැනිලි	-	50	(01) -	ශේෂය ඉ/ගෙ	200	100	-
ගෙවූ ණය පොලී	-	-	30	ණය පොලී	-	-	(01) 40
				ප්‍රාග්ධන පොලී	118	118	64
ගෙවූ වේතන	-	480	-	වේතන (02)	-	480	480
ශේෂය ප/ගෙ	690	540	740	ලාභ කොටස්	372	372	186
	690	1 070	770		690	1 070	770

(ලකුණු 07)

(ආ) සපත්තු නිෂ්පාදනයේ නියුතු ඩෙල්වින් සමාගමට නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ නඩත්තු කටයුතු සඳහා වූ සේවා දෙපාර්තමේන්තුවක් ඇත. ඒකක 5 000 ක ක්‍රියාකාරී මට්ටමේ දී ඉදිරි වර්ෂය සඳහා අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

විස්තරය	එකතුව	නිෂ්පාදන දෙපාර්තමේන්තුව A	නිෂ්පාදන දෙපාර්තමේන්තුව B	නඩත්තු දෙපාර්තමේන්තුව
වක්‍ර වැටුප් (රු.)	75 000	46 000	13 000	16 000
යන්ත්‍ර ක්ෂය (රු.)	30 000	20 000	10 000	–
කුලී (රු.)	90 000	?	?	?
ආරක්ෂක ගාස්තු (රු.)	45 000	?	?	?
විදුලිය (රු.)	80 000	?	?	?
යන්ත්‍ර පැය	15 000	10 000	5 000	–
ශ්‍රම පැය	14 000	2 000	12 000	–
භූමි ප්‍රමාණය (වර්ග මීටර)	9 000	3 800	3 600	1 600
ආරක්ෂක සේවකයන් සංඛ්‍යාව	15	7	7	1
කිලෝවොට් පැය	1 600	1 000	500	100

අතිරේක තොරතුරු:

(i) නඩත්තු දෙපාර්තමේන්තුවේ මුළු පොදු කාර්ය පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු **A** සහ **B** අතර පිළිවෙළින් 5:3 අනුපාතයට විභජනය කළ යුතු ය.

(ii) **A** නිෂ්පාදන දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය ද, **B** නිෂ්පාදන දෙපාර්තමේන්තුව ශ්‍රම පැය ද පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය සඳහා යොදා ගැනේ.

(iii) සපත්තු යුගලයක් නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදන දෙපාර්තමේන්තු **A** සහ **B** හි පිළිවෙළින් පැය 5 ක් සහ පැය 3 ක් ගත කරයි.

(iv) එක් සපත්තු යුගලයක් නිෂ්පාදනය කිරීම සඳහා සෘජු පිරිවැය:

අමුද්‍රව්‍ය	යුගලයකට රු. 30
ශ්‍රමය	යුගලයකට රු. 20

(v) නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය:

විචල්‍ය	යුගලයකට රු. 25
ස්ථාවර	රු. 105 000

අවශ්‍යවන්නේ:

(1) විභජන පදනම නම් කරමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) සපත්තු යුගලයක නිෂ්පාදන පිරිවැය

(4) ක්‍රියාකාරී මට්ටම ඒකක 5 000 දී මුළු පිරිවැය

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 20 යි)

(ආ) (1) පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව රු' 000

අයිතමය	විභජන පදනම	එකතුව	නිෂ්පාදන දෙපාර්තමේන්තු		සේවා දෙපාර්තමේන්තුව
			A	B	නඩත්තු
වක්‍ර වැටුප්	සෘජු	75 000	46 000	13 000	16 000 (01)
යන්ත්‍ර ක්ෂය	සෘජු	30 000	20 000	10 000	- (01)
කුලිය	භූමි ප්‍රමාණය (38:36:16) (01)	90 000	38 000	36 000	16 000 (01)
ආරක්ෂක ගාස්තු	සේවක සංඛ්‍යාව (7:7:1) (01)	45 000	21 000	21 000	3 000 (01)
විදුලිය	කිලෝවොට් පැය (10:5:1) (01)	80 000	50 000	25 000	5 000 (01)
		320 000	175 000	105 000	40 000
නඩත්තු දෙපාර්තමේන්තු පොදු කාර්ය පිරිවැය නැවත විභජනය	(5:3)	(01) -	25 000 (01)	15 000	(40 000)
		320 000	200 000	120 000	-

(ලකුණු 10)

(2) පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

A — යන්ත්‍ර පැයකට = රු. 20 (02)

B — ශ්‍රම පැයකට = රු. 10 (02)

පෙරවැඩ

A

[01] $\frac{200\ 000}{10\ 000}$ = රු. 20 [01]

B

[01] $\frac{120\ 000}{12\ 000}$ = රු. 10 [01]

(ලකුණු 04)

(3) සපත්තු යුගලයක නිෂ්පාදන පිරිවැය රු. 180 (03)

පෙරවැඩ		රු	
සෘජු අමුද්‍රව්‍ය		30	[01]
සෘජු ශ්‍රමය	[01]	20	
පොදු කාර්ය පිරිවැය A - 20 × 5	[01]	100	
B - 20 × 5		30	
		180	

(ලකුණු 03)

(4) ඒකක 5000 දී මුළු පිරිවැය රු. 1 130 000 (04)

පෙරවැඩ	රු	
නිෂ්පාදන පිරිවැය 5000 × 180	900 000	[02]
නිෂ්පාදන නොවන - විචල්‍ය 5000 × 25	125 000	[01]
ස්ථාවර පිරිවැය	105 000	[01]
	1 130 000	

(ලකුණු 04)

(මුළු ලකුණු 40)

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 x 2 = ලකුණු 40කි.
2 ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයක් වුවද ඒ සඳහා පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 99%ක් පමණි.
ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 31 හෝ 31ට වඩා ලකුණු ලබාගත් පිරිස අපේක්ෂකයින්ගෙන් 31%ක් පමණක් වන අතර, අපේක්ෂකයින් 22%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10 හෝ ඊට අඩුවෙනි. මෙම ප්‍රශ්නය සඳහා වෙන් කළ ලකුණු ප්‍රමාණයෙන් ලකුණු 20කටත් වඩා ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 59%ක් විය.



සමස්ථයක් ලෙස අනුකොටස් 7කින් යුත් මෙම ප්‍රශ්නයේ පහසුතාව ඉහළ අගයක් ගනී. පහසුතාව වැඩිම අනුකොටස (ආ) (1) වන අතර එහි පහසුතාවය 87%කි. පහසුතාව අඩුම අනුකොටස (අ) 2 වේ. එහි පහසුතාව 42%කි.

2 වන ප්‍රශ්නයේ (අ) (1) කොටසෙහි පහසුතාව 86%කි. එයින් පිරික්සා ඇත්තේ සංශෝධිත මුදල් ශේෂය සෙවීම හා බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කිරීම පිළිබඳ අවබෝධයයි. ඒ අනුව අපේක්ෂකයින්ගෙන් බහුතරයක් මෙම කොටස සඳහා සාර්ථකව පිළිතුරු සපයා ඇති බව කිව හැකිය.

(අ) 2 මෙම කොටසේ පහසුතාව 42%කි. මෙයින් පරීක්ෂා කිරීමට යොමු වී ඇත්තේ සේවා සපයන හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය සකස් කිරීම පිළිබඳ දැනුම හා අවබෝධයයි. ලකුණු අඩුවීමට හේතු වූ කරුණු අතුරින් සේවා සපයන ව්‍යාපාරයක අදායම් ප්‍රකාශනය සකස් කිරීම පිළිබඳ අවබෝධය දුර්වල මට්ටම පැවතීමත් උපදේශන ආදායම නිවැරදිව හඳුනා නොගැනීමයි. සේවා සපයන ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉහත අනෙකුත් කරුණු ආවරණය වන පරිදි ප්‍රායෝගික අභ්‍යාස යොදාගෙන ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය සංවිධානය වීම වැදගත් විය හැක.

(අ) 3 මෙම කොටසේ පහසුතාවය 62%කි. මෙයින් පිරික්සා ඇත්තේ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් සකස් කිරීම පිළිබඳ දැනුම සහ අවබෝධයයි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයින් විසින් ජංගම ගිණුම පිළියෙල කිරීමේදී ගෙවූ ණය පොලිය හා ගෙවූ චේතන ජංගම ගිණුමට හර කර නොතිබීම යන දුර්වලතා හඳුනා ගත හැකි විය.

(ආ) 1 කොටසේ පහසුතාවය 87%ක් වූ අතර, මෙයින් පිරික්සා ඇත්තේ පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව පිළියෙල කිරීම පිළිබඳ අවබෝධයයි. අපේක්ෂකයින්ගෙන් බහුතරයක් එයට සාර්ථකව පිළිතුරු සපයා ඇති බව පෙනී යයි.

(ආ) 2 කොටසේ පහසුතාවද 85%ක් වැනි ඉහළ මට්ටමක පැවති අතර, එයින් පිරික්සා තිබුණේ පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත ගණනය කිරීම පිළිබඳ දැනුම සහ අවබෝධය යයි.

(ආ) 3 කොටසේ පහසුතාවය ද 70%සැලකිය යුතු මට්ටමක පැවති අතර, එයින් පිරික්සා තිබුණේ නිෂ්පාදිතයක මුළු නිශ්පාදන පිරිවැය සෙවීම සම්බන්ධ දැනුම වේ. අපේක්ෂකයින්ගෙන් සුළු පිරිසක්, සපත්තු යුගලයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත, සත්‍ය පැය ගණනින් ගුණ කර නොතිබීම දුර්වලතාවයකි.

(ආ) 4 කොටසේ පහසුතාවය 53%ක් වූ අතර, යම් ක්‍රියාකාරී මට්ටමක දී මුළු පිරිවැය සෙවීමේ අවබෝධය පිරික්සා තිබුණි. අපේක්ෂකයින්ගෙන් සැලකිය යුතු පිරිසක් මුළු පිරිවැය ගණනය කිරීමේදී නිෂ්පාදන නොවන විචල්‍ය පිරිවැය සහ නිෂ්පාදන නොවන ස්ථාවර පිරිවැය සැලකිල්ලට ගෙන නොතිබීම දක්නට ලැබුණි.

මුළු පිරිවැය ගණනය කිරීමේදී නිෂ්පාදන පිරිවැය මෙන්ම නිෂ්පාදන නොවන පිරිවැය ද සැලකිල්ලට ගත යුතු බව අවබෝධවන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වීම වැදගත් වනු ඇත.

03 ප්‍රශ්නය

3. සමන් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයේ රු. 600 000 ක ලාභයක් වාර්තා කරන ලදී. 2016.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 50 000 ක මුදල් ශේෂයක් පෙන්වන ලදී. කෙසේ වුව ද ඔහු ගිණුම් පොත් නිසියාකාරව පවත්වා නොගනී. පහත ගනුදෙනු ගිණුම් පොත්වල වාර්තා කර නොමැති බව පසුව හෙළිදරව් විය.

අංකය	ගනුදෙනුව
1	රු. 80 000 කට භාණ්ඩ ණයට විකිණීම. මෙම භාණ්ඩවල පිරිවැය රු. 60 000 ක් විය.
2	රු. 36 000 කට ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම. මෙම භාණ්ඩවල පිරිවැය රු. 30 000 ක් විය.
3	පිරිවැය රු. 10 000 ක් වූ භාණ්ඩ පරිත්‍යාග කිරීම.
4	ව්‍යාපාරයේ නඩත්තු වියදම් රු. 10 000 ක් විය. මෙයින් රු. 6 000 ක් සමන් විසින් පුද්ගලික ව ගෙවන ලද අතර ඉතිරිය ව්‍යාපාරය විසින් ගෙවන ලදී.
5	2015.07.01 දින 12% ක වාර්ෂික පොලියට රු. 300 000 ක බැංකු ණයක් ලබා ගැනීම. පොලිය මෙතෙක් ගෙවා නොමැත.
6	2016.03.31 දින රු. 280 000 ක අත්පිට මුදලට ත්‍රී රෝද රථයක් මිල දී ගැනීම.
7	ණයගැතියකුගෙන් අය විය යුතු රු. 30 000 ක් ඔහුට ණයහිමියකු ලෙස ගෙවිය යුතු වූ රු. 50 000 කට එරෙහිව හිලව් කිරීම. ඉතිරිය මුදලින් ගෙවන ලදී.
8	රු. 12 000 ක් සමන්ගේ ජීවිත රක්ෂණ වාරිකය වෙනුවෙන් ගෙවා ඇත.
9	ගනුදෙනු අංක 1ට අදාළ ව ලැබිය යුතු මුදල 5% ක වට්ටමක් අඩු කිරීමෙන් පසු ලැබීම.
10	පෙර වර්ෂයක දී බොල් ණය ලෙස කපා හල රු. 15 000 ක් ලැබීම.

අවශ්‍යවන්නේ:

(1) මෙම ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (–) ද යන්න සඳහන් කරන්න. (පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න).

රු.'000

ගනුදෙනු අංකය	වත්කම්				වගකීම්			හිමිකම
	දේපළ, පිරියත සහ උපකරණ	තොග	වෙළෙඳ ලැබිය යුතු දෑ	මුදල්	දිගුකාලීන ණය	වෙළෙඳ ගෙවිය යුතු දෑ	වෙනත් ගෙවිය යුතු දෑ	

(2) 2016.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය

(3) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංශෝධිත ලාභය (හිමිකම මත ගනුදෙනුවල ශුද්ධ බලපෑම පදනම්ව)

(මුළු ලකුණු 15 යි)

පිළිතුර

ප්‍රශ්න අංක 03

(3) (1)

ගනුදෙනු අංකය	වත්කම්			වගකීම්				හිමිකම්	
	දේපල පිරියත සහ උපකරණ	තොගය	වෙළෙඳ ලැබිය යුතු දෑ	මුදල්	දිගුකාලීන ණය	වෙළෙඳ ගෙවිය යුතු දෑ	වෙනත් ගෙවිය යුතු දෑ		
1		-60	+80					+20	02
2		+30	-36					-6	02
3		-10						-10	01
4				-4		01		+6 -10	03 02
5				+300	+300		+27	-27	01
6	+280			-280					03
7			-30	-20		-50			01
8				-12				-12	03
9			-80	+76				-4	02
10				-15				-15	
	280	-40	-66	75	300	-50	27	-28	

(ලකුණු 21)

(2)

පෙරවැඩ	රු	
නිවැරදි කිරීමට පෙර මුදල් ශේෂය	50	01
ඉහත ගනුදෙනු වලින් වූ බලපෑම	75	03
	125	

(ලකුණු 04)

(3)

විකල්ප පෙරවැඩ

මුදල් ගිණුම (රු'000)

ශේෂය ඉ/ගෙ	50	නඩත්තු වියදම්	4
බැංකු ණය	300	ත්‍රීරෝද රථ ගැණුම්	280
ණයගැති ලැබීම්	76	ණයහිමියන්ට ගෙවීම්	20
කපාහල බොල්ණය ආපසු ලැබීම	15	ගැනිලි (රක්ෂණ වාරික ගෙවීම)	12
		ශේෂය ප/ගෙ	125
	441		441

(අවසාන ශේෂය හැර ඕනෑම අයිතම 2 කට ලකුණු 01 බැගින් ලකුණු 04)

(3) සංශෝධිත ලාභය රු. 578 (05)

පෙරවැඩ		රු	
කෙටුම්පත් ලාභය		600	
(-) හිමිකමේ අඩුවීම	02	(28)	
(+) ගැනිලි		12	01
(-) අමතර ප්‍රශ්ධනය		(6)	01
සංශෝධිත ලාභය		578	

විකල්ප පෙරවැඩ		
කෙටුම්පත් ලාභය	(රු'000)	
දළ ලාභයෙහි වැඩි වීම	600	
ආපසු එවුම්	20	01
වියදම් (10 000 + 10 000 + 27 000 + 4 000)	(6)	01
බොල් ණය ආපසු ලැබීම	(51)	01
	15	01
	578	

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.

3 ප්‍රශ්නය අපේක්ෂකයින්ගෙන් 93%ක් පමණ තෝරා ගෙන ඇත.

ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 25%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වඩා ලකුණු ලබාගත් පිරිස 25%ක් වන අතර ලකුණු 7 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස අපේක්ෂකයින්ගෙන් 17%කි. අපේක්ෂකයින්ගෙන් 56%ක්ම මෙම ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අඩකට වඩා ලබාගෙන තිබුණි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 3 අතුරෙන් සාපේක්ෂව පහසුතාව වැඩිම කොටස (1) වන අතර එහි පහසුතා මට්ටම 68%කි. එසේම පහසුතාවය අඩුම කොටස (3) වන අතර එහි පහසුතාව මට්ටම 34% කි.

(3) (1) කොටසේ පහසුතාවය 68%ක ඉහළ මට්ටමක පැවති අතර, මෙම ප්‍රශ්නය මගින් ගිණුම්කරණ සමීකරණ පිළිබඳ දැනුම පිරික්සා ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී සමීකරණයට විවිධ ගනුදෙනුවල බලපෑම දැක්වීමේදී ව්‍යාපාරයේ නඩත්තු වියදම්, අයිතිකරුගේ පෞද්ගලික වියදමින් දැරුවිට සටහන් කළ යුතු ආකාරය හොඳින් වටහා නොගැනීම ද බැංකුණය සඳහා පොලිය ගණනයේදී ණය ලබාගත් දිනය පිළිබඳ සැලකිලිමත් නොවීම ද අපේක්ෂකයින් විසින් දක්වා ඇති දුර්වලතාවයන් වේ.

(2) වන කොටසේ පහසුතාවය 59%ක් වූ අතර, එමගින් පිරික්සා ඇත්තේ සංශෝධිත මුදල් ශේෂය සෙවීම පිළිබඳ දැනුමයි. කෙසේ වෙතත් සැලකිය යුතු අපේක්ෂකයින් පිරිසක් සංශෝධිත මුදල් ශේෂය ගණනය කිරීමේදී මුදල් ලැබීම්, මුදල් ගෙවීම්වලින් මුදල් ශේෂයට වන බලපෑම අවබෝධ කරගෙන නොතිබුණි.

(3) මෙම කොටසේ පහසුතාවය 34%ක ඉතා අඩු මට්ටමක පැවති අතර, එමගින් පිරික්සා කර ඇත්තේ සංශෝධිත ලාභය ගණනය කිරීමයි. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් විසින් පෙන්නුම් කරන ලද ප්‍රධාන දුර්වලතාවයන් අතර ශුද්ධ ලාභය (ලාභ සංශෝධනය) ගණනය කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රමවේදය දක්වා තිබුණත් එය අවබෝධ කර නොගෙන වෙනත් ක්‍රමවලට ලාභය ගණනය කිරීමට උත්සාහ දැරීම ප්‍රධාන වේ. ලාභය/අලාභය ගණනය කිරීමේදී මෙන්ම අසම්පූර්ණ වාර්තාවලදී එය සංශෝධනය කිරීමේදීද ලාභ සමීකරණය යොදා ගැනීම පිළිබඳ අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය වීම වැදගත් වනු ඇත.

04 ප්‍රශ්නය

4. දිමුතු ඔහුගේ පුද්ගලික ඉතුරුම්වලින් රු. 900 000 ක් ආයෝජනය කරමින් 2016.04.01 දින නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2016 අප්‍රේල් මාසය තුළ දී සිදු කරන ලද ගනුදෙනුවල සාරාංශය පහත දී ඇත.

(i) මුදල් ලැබීම් සහ ගෙවීම් ජර්නල්වල සටහන් කළ ගනුදෙනුවල සාරාංශය:

ලැබීම්:	**රු.'000**
විකුණුම්	6 000
ණයගැතියන්ගෙන් ලැබීම්	2 000
ගෙවීම්:	
අමුද්‍රව්‍ය ගැනුම්	1 200
ණයහිමියන්ට ගෙවීම්	800
අමුද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා ගෙවූ අත්තිකාරම්	300
යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ වේතන	400
නිෂ්පාදන සුපරීක්ෂකවරුන්ගේ වැටුප්	700
කර්මාන්තශාලා විදුලිය	60
කර්මාන්තශාලා කුලී	600
පරිපාලන වියදම්	200
යන්ත්‍රයක් මිල දී ගැනීම (2016.04.01 දින)	4 000

(ii) අනෙකුත් මූලික සටහන් පොත්වල එකතුන්:

	රු.'000
විකුණුම් ජර්නලය	12 000
ගැනුම් ජර්නලය	8 000
ආපසු එවුම් ජර්නලය	500

(iii) අමුද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් ගෙවූ අත්තිකාරම සඳහා, රු. 100 000 ක් වටිනා අමුද්‍රව්‍ය පමණක් 2016.04.27 දින ලැබුණි. මෙය මෙතෙක් ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(iv) ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු. 300 000 ක් අයකර ගත නොහැකි අතර එය බොල්ණය ලෙස කපා හැරිය යුතු වේ.

(v) මාසික කර්මාන්තශාලා කුලිය රු. 200 000 ක් වන අතර පළමු කාර්තුව සඳහා කුලී ගෙවා ඇත.

(vi) 2016 අප්‍රේල් මාසය සඳහා රු. 50 000 ක් වූ විදුලි බිල 2016.05.10 දින ලැබී ඇත.

(vii) යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 10 ක් වන අතර සුන්බුන් අගය රු. 400 000 කි. යන්ත්‍ර, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(viii) මාසය අවසානයේ දී තොග ශේෂයන් පහත පරිදි විය:

	රු.'000
අමුද්‍රව්‍ය	300
නොනිමි ද්‍රව්‍ය (නිෂ්පාදන පිරිවැයට අගය කළ)	80
නිමි භාණ්ඩ	100

අවශ්‍යවන්නේ:

(1) 2016 අප්‍රේල් මාසය සඳහා පොදු ලෙජරයේ පහත ගිණුම් (T ආකෘතිය භාවිත කරමින්):
   (i) විකුණුම්
   (ii) ණයගැති පාලන
   (iii) අමුද්‍රව්‍ය ගැනුම්
   (iv) ණයහිමි පාලන
   (v) අත්තිකාරම් ගෙවීම්

(2) 2016 අප්‍රේල් මාසය සඳහා නිෂ්පාදන ගිණුම

(3) 2016 අප්‍රේල් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

(4) 2016.04.30 දිනට පහත අයිතමවල අගයන්:
   (i) දේපළ, පිරියත සහ උපකරණ
   (ii) ඉදිරියට ගෙවූ වියදම්
   (iii) හිමිකම්

(මුළු ලකුණු 15 යි)

පිළිතුර

ප්‍රශ්න අංක 04

04. (1) **විකුණුම් ගිණුම** (රු'000)

ලාභාලාභ ගිණුම	1 800	මුදල්	6 000	(01)
		ණයගැති පාලන	12 000	
	1 800		18 000	(01)

(2) **ණයගැති පාලන ගිණුම**

විකුණුම්	12 000	මුදල්	2 000	(01)
		ආපසු එවුම්	500	
		බොල් ණය	300	(01)
		ශේෂය ප/ගෙ	9 200	(01)
	12 000		12 000	

(3) **අමුද්‍රව්‍ය ගැනුම් ගිණුම**

මුදල්	1 200	(01)	ලාභාලාභ ගිණුම		9 300
ණයහිමි පාලන	8 000	(01)			
අත්තිකාරම්	100	(01)			
	9 300				9 300

(4) **ණයහිමි පාලන ගිණුම**

මුදල්	800	(01)	ලාභාලාභ ගිණුම	8 000
ශේෂය ප/ගෙ	7 200			
	8 000			8 000

(5) අත්තිකාරම් ගෙවීම් ගිණුම

මුදල්	300 (01)	අමුද්‍රව්‍ය ගැනුම්	100
		ශේෂය ප/ගෙ	200
	300		300

(ලකුණු 13)

(2) දිමුතු නිෂ්පාදන ව්‍යාපාරය
2016 අප්‍රේල් මාසය සඳහා නිෂ්පාදන ගිණුම

(රු'000)

අමුද්‍රව්‍ය ගැනුම්		(01) 9 300	
2016.04.30 දිනට තොගය		(300)	(01)
පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය		9 000	
සෘජු වේතන			
යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ වේතන		400	(01)
ප්‍රාථමික පිරිවැය		9 400	
නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය			
නිෂ්පාදන සුපරීක්ෂක වැටුප්	700	(01)	
විදුලිය	50	(01)	
කර්මාන්ත ශාලා කුලී	200	(01)	
යන්ත්‍ර ක්ෂය	30	(01) 980	
		10 380	
2016.04.30 දිනට නොනිමි තොගය		(80)	(01)
මුළු නිෂ්පාදන පිරිවැය		10 300	

(ලකුණු 08)

(3) දිමුතු නිෂ්පාදන ව්‍යාපාරය
2016 අප්‍රේල් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

(රු'000)

විකුණුම්	18 000	(01)
ආපසු එවුම්	(500)	(01) 17 500
නිෂ්පාදන පිරිවැය	(01) 10 300	
2016.04.30ට නිමි තොගය	(100)	(01) (10 200)
		7 300
දළ ලාභය		
වියදම්		
පරිපාලන වියදම්	200	(01)
බොල් ණය	300	
		(500)
ලාභය		6 800

(ලකුණු 05)

(රු' 000)

(4) (i) 2016.04.30 දිනට දේපළ, පිරියත හා උපකරණ 3 970 (01)

පෙර වැඩ	(රු' 000)
යන්ත්‍රයේ පිරිවැය	4 000
ක්ෂය	(30) [01]
	3 970

(රු' 000)

(ii) ඉදිරියට ගෙවූ වියදම් 410

පෙර වැඩ	(රු' 000)
ඉදිරියට ගෙවූ කුලී	400 [01]
ඉදිරියට ගෙවූ විදුලිය	10 [01]
	410

(රු' 000)

(iii)හිමිකම = 7 700 (01)

පෙර වැඩ	(රු' 000)
2016.04.01ට ප්‍රාග්ධනය	900
ලාභය	[01] 6 800
	7 700

(ලකුණු 04)

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30 කි.
4 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 64%ක් පමණි.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් පිරිස 22%ක් පමණක් වන අතර අපේක්ෂකයින්ගෙන් 26%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් අතරින් කොටස් 6කම පහසුතාව 51%ට වඩා ඉහළය. පහසුතාව අවම අනුකොටස 4(iii) වන අතර එහි පහසුතාව 32%කි.

(4) (අ) (i) කොටසේ පහසුතාවය 96%කි. අපේක්ෂකයින් ගිණුම්කරණ ක්‍රියාවලිය නිවැරදි ව අවබෝධ කර ගැනීම නිසා එසේ ඉහළ ප්‍රතිශතයක් ලබා ඇති බව කිව හැකිය.

(1) (ii) කොටසේ පහසුතාවය 72%කි. ණයගැති පාලන ගිණුමේ හරට සහ බැරට අදාළ අයිතම නිවැරදි ව හඳුනා නොගැනීම. මෙම ප්‍රතිශතය ඉහළ නංවා ගැනීමට පාලන ගිණුම් පිළිබඳ අවබෝධය තවදුරටත් අවශ්‍ය බව පෙනේ.

(1) (iii) කොටසේ පහසුතාවය 58%කි. අමුද්‍රව්‍ය මිලදී ගැනීමට ගෙවූ මුළු අත්තිකාරම් මුදලම අමුද්‍රව්‍ය ගැණුම් ගිණුමට හර කිරීම නිසා නිවැරදි ගැණුම් වටිනාකම ගණනය කිරීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ඉදිරියට ගෙවූ අත්තිකාරම් සම්බන්ධ ගිණුම් තබන ආකාරය පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම තුළින් මෙම ප්‍රතිශතය ඉහළ නංවා ගත හැකිය.

(1) (iv) කොටසේ පහසුතාවය 71%කි. පාලන ගිණුම් පිළිබඳ අවබෝධය අල්පවීම නිසා මෙම කොටසට පිළිතුරු ලියා නොතිබීම දක්නට ලැබුණි. පාලන ගිණුම් පිළිබඳ අවබෝධය ලබාදීමෙන් මේ තත්ත්වය මඟහරවා ගත හැකිය.

(1) (v) කොටසේ පහසුතාව 64%කි. අත්තිකාරම්වලින් ගිණුම් කාලච්ඡේදයට අදාළ ප්‍රමාණය හඳුනා නොගැනීම දක්නට ලැබුණි. මේ පිළිබඳ දැනුවත් වූයේ නම් මෙම ප්‍රතිශතය ඉහළ නංවා ගැනීමට හැකිවනු ඇත.

4.2 කොටසේ පහසුතාවය 49%කි. මෙයින් පිරික්සා ඇත්තේ නිෂ්පාදන ගිණුම සකස් කිරීම පිළිබඳ අවබෝධයයි. කර්මාන්ත ශාලා කුලිය, විදුලිය, යන්ත්‍ර ක්ෂය යන වියදම්වලින් ගිණුම් කාලච්ඡේදයට අදාළ ප්‍රමාණය වෙන් කොට හඳුනා නොගැනීම. උපචිත සංකල්පයට අනුව ගිණුම් තැබීමේ අවබෝධය අල්ප වීම. ඊට හේතු විය හැකිය. ගිණුම් තැබීමේදී ගිණුම් කාලච්ඡේදයට අදාළ දිනයන් පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව ද පෙනේ.

4.3 කොටසේ පහසුතාවය 51%කි. මෙයින් පරීක්ෂා කර ඇත්තේ ආදායම් ප්‍රකාශනය සකස් කිරීම පිළබිඳ දැනුම හා අවබෝධයයි. නිෂ්පාදන ගිණුමට හා ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු අයිතම වෙන් කොට හඳුනා නොගැනීම හා නිෂ්පාදන පිරිවැය ආදායම් ප්‍රකාශනයට මාරු කිරීම පිළිබඳ අවබෝධය නොමැතිවීම දැක්විය හැකිය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානයේදී නිෂ්පාදන ගිණුම හා ආදායම් ප්‍රකාශනය එකවර පිළියෙල කරවීමෙන් මෙම තත්ත්වය මඟහරවා ගත හැකිය.

4.i කොටසේ පහසුතාවය 41%කි. යන්ත්‍ර ක්ෂය, මාසයක් සඳහා පමණක් ගණනය කළ යුතු බව අවබෝධය කර නොගැනීම, පහසුතාව මෙම මට්ටම දක්වා පහල බැසීමට හේතුවිය.

4.ii කොටසේ පහසුතාවය 38%කි. ගිණුම් කාලච්ඡේදයට අදාළ ඉදිරියට ගෙවූ වියදම් හඳුනා නොගැනීම ඊට හේතු විය හැක.

4.iii කොටසේ පහසුතාවය 22%කි. 4 ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් වුවද මෙම කොටසට පිළිතුරු ලියා නොතිබීම, මෙයට හේතුවේ.

ගිණුම් කාලච්ඡේදයට අදාළ ආදායම්, වියදම් ගණනය කරන විට අදාළ දිනය සැලකිල්ලට ගෙන ගණනය කළ යුතු බව අවධාරණය වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

05 ප්‍රශ්නය

5. (අ) නිෂ්පාදන සමාගමක් එහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා දැනට පවතින යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 5 කි. පහත ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන් මෙම යන්ත්‍ර දෙක හා බැඳේ.

විස්තරය	නව යන්ත්‍රය (රු.'000)	දැනට පවතින යන්ත්‍රය (රු.'000)
පිරිවැය	1 000	–
වර්තමාන වෙළෙඳපළ වටිනාකම	–	300
සුන්බුන් වටිනාකම	200	–
වාර්ෂික මෙහෙයුම් පිරිවැය:		
වර්ෂය 1	100	300
වර්ෂය 2	100	300
වර්ෂය 3	120	320
වර්ෂය 4	120	320
වර්ෂය 5	140	360

නව යන්ත්‍රය මිල දී ගන්නේ නම් ව්‍යාපෘතිය ආරම්භයේ දී රු. 280 000 ක අතිරේක කාරක ප්‍රාග්ධනයක් අවශ්‍ය වන අතර එය ව්‍යාපෘතිය අවසානයේ දී නැවත ලබා ගත හැකි ය. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% කි.

10% වට්ටම් සාධක (දශමස්ථාන දෙකකට) පහත පරිදි වේ :

වර්ෂය	1	2	3	4	5
වට්ටම් සාධකය	0.91	0.83	0.75	0.68	0.62

අවශ්‍යවන්නේ:

(1) මෙම ව්‍යාපෘතියේ මුදල් ගලායාම් සහ ගලාඒම් ඇතුළත් ලේඛනයක්
(2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය
(3) ශුද්ධ වර්තමාන අගය මත පදනම් ව ව්‍යාපෘතිය තෝරාගැනීම පිළිබඳ නිර්දේශය **(ලකුණු 05 යි)**

පිළිතුර
ප්‍රශ්න අංක 05

05. (අ) මුදල් ප්‍රවාහ (රු'000)

අයිතමය \ වර්ෂය	0	1	2	3	4	5	
මුදල් ගලා ඒම් :							
පැරණි යන්ත්‍රය විකිණීම	300	(01) දෙකකට ලකුණු		01 බැගින්	උපරිම ලකුණු	(02)	
මෙහෙයුම් පිරිවැයේ ඉතිරිය	-	200	200	200	200	220	(01)
කාරක ප්‍රග්ධනය ආපසු ලැබීම්						280	(01)
සුන්බුන් අගය						200	
	300	200	200	200	200	700	
මුදල් ගලායෑම් :							
යන්ත්‍රයේ පිරිවැය	(1 000)	(01)					
කාරක ප්‍රාග්ධනය	(280)	(01)				-	
	(1 280)	-	-	-	-	-	
ශුද්ධ මුදල් ප්‍රවාහය	(980)	200	200	200	200	700	

(ලකුණු 07)

(රු' 000)

(2) ශුද්ධ වර්තමාන අගය (NPV) = 1 068 000 - 980 000 = රු. 88 000 (01) **(ලකුණු 02)**

පෙරවැඩ

වර්ෂ		ශුද්ධ මුදල් ප්‍රවාහ	වට්ටම් සාධක	(රු'000) වර්තමාන අගය	
0		(980)	1.0	(980)	
1		200	0.91	182	
2		200	0.83	166	
3	01	200	0.75	150	01
4		200	0.68	136	
5		700	0.62	434	
			ශුද්ධ වර්තමාන අගය	88	

(3) ශුද්ධ වර්තමාන අගය ධන බැවින් ව්‍යාපෘතිය පිළිගැනීම යෝග්‍ය වේ. (01) **(ලකුණු 01)**

(ආ) පාසලක ගුරුවරුන්ගේ සුභසාධක සංගමයක් එහි සාමාජිකයින් සඳහා සුභද හමුවක් සංවිධානය කරමින් සිටී. මෙම සංගමයේ සාමාජිකත්වය දැනට සේවයෙහි නියුතු ගුරුවරුන් 120 කින් සහ විශ්‍රාමික ගුරුවරුන් 30 කින් සමන්විත වේ. මෙම හමුව සඳහා පහත වියදම් ඇස්තමේන්තු කර ඇත.

		රු.
සංග්‍රහ වියදම්	එක් සාමාජිකයකුට	1 100
සමරු කලාපය	එක් සාමාජිකයකුට	225
තෑගි පාර්සලය	එක් සාමාජිකයකුට	775
හෝටල් ගාස්තු		35 000
ශාලා සැරසිලි		5 000
ශබ්ද විකාශන යන්ත්‍ර කුලී		2 000
හමුව සංවිධානය කිරීමේ වියදම්		3 000

විශ්‍රාමික ගුරුවරුන් ද ඇතුළුව සහභාගී වන සියලු ගුරුවරුන්ට ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමට සංගමය බලාපොරොත්තු වේ. ප්‍රවේශ පත්‍රයක් රු. 3 000 කට මිල කර ඇත. අතිරික්ත මුදල් පුණ්‍ය කටයුත්තක් සඳහා යොදවනු ඇත.

අවශ්‍යවන්නේ:

සුභද හමුවට අදාළ ව පහත දැ ගණනය කරන්න:

(1) එක් ගුරුවරයකු මත දායකය

(2) මුළු පිරිවැය ආවරණය කිරීමට සහභාගී විය යුතු ගුරුවරු සංඛ්‍යාව

(3) සියලු ම ගුරුවරුන් සහභාගී වන්නේ නම්, පුණ්‍ය කටයුත්ත සඳහා පරිත්‍යාග කළ හැකි මුදල

(4) රු. 27 000 ක් පුණ්‍ය කටයුතු සඳහා පරිත්‍යාග කිරීම පිණිස සහභාගී විය යුතු ගුරුවරු සංඛ්‍යාව

(5) සියලු ම ගුරුවරුන් සහභාගී වන්නේ නම්, ප්‍රවේශ පත්‍රයක් විකිණිය හැකි අවම මිල

(6) විශ්‍රාමික ගුරුවරුන්ට ප්‍රවේශ පත්‍ර මිල දී ගැනීම අවශ්‍ය නොවන්නේ නම් සහ ඔවුන්ගෙන් 24 දෙනෙකු පැමිණීම අපේක්ෂා කරන්නේ නම්, මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා විකිණිය යුතු ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව

(ලකුණු 10 යි)
(මුළු ලකුණු 15 යි)

පිළිතුර

05. (ආ) (1) එක් ගුරුවරයකු මත දායකය = රු.900 (04)

පෙරවැඩ

විකුණුම් ආදායම - විචල්‍ය පිරිවැය

3 000 [01] - 2 100 [03] = 900

විචල්‍ය පිරිවැය :

සංග්‍රහ වියදම්	1 100 [01]
සමරු කලාපය	225 [01]
තෑගි පාර්සලය	775 [01]
	2 100

(2) මුළු පිරිවැය ආවරණය කිරීමට සහභාගි විය යුතු ගුරුවරු සංඛ්‍යාව = 50 (05)

පෙරවැඩ

$$\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකක දායකය}} = \frac{45\,000\ [04]}{[01]\ 900}$$

ස්ථාවර පිරිවැය :

හෝටල් ගාස්තුව	35 500 [01]
ශාලා සැරසිලි	5 000 [01]
ශබ්ද විකාශන යන්ත්‍ර කුලී	2 000 [01]
හමුව සංවිධානය කිරීමේ වියදම්	3 000 [01]
	45 000

(3) සියළුම ගුරුවරුන් සහභාගී වන්නේ නම් පුණ්‍ය කටයුත්ත සඳහා පරිත්‍යාග කළ හැකි මුදල = රු. 90 000 (03)

පෙරවැඩ

මුළු දායකය	= [01] 900 × 150 [01]	=	135 000
(-) ස්ථාවර පිරිවැය		=	45 000
			90 000

විකල්ප පෙරවැඩ

[01] 900 × (150 - 50)

[01] [01]

90 000

(4) රු. 27 000ක් පුණ්‍ය කටයුතු සඳහා පරිත්‍යාග කිරීම පිණිස සහභාගී විය යුතු ගුරුවරු සංඛ්‍යාව = රු. 80 (03)

පෙරවැඩ

$$\frac{\text{ස්ථාවර පිරිවැය + පරිත්‍යාග මුදල}}{\text{ඒකක දායකය}}$$

$$\frac{[01]\ 45\,000 + 27\,000\ [01]}{[01]\ 900} = 80$$

(5) සියළුම ගුරුවරු සහභාගීවන්නේ නම් ප්‍රවේශ පත්‍රයක් විකිණිය හැකි අවම මිල = රු. 2 400 (03)

පෙරවැඩ

$$= \frac{\text{මුළු පිරිවැය}}{\text{සහභාගී වන ගුරුවරු සංඛ්‍යාව}}$$

$$= \frac{\boxed{01}\ 315\,000 + \boxed{01}\ 45\,000}{150\ \boxed{01}}$$

$$= \underline{2\ 400}$$

විකල්ප පෙරවැඩ

150 $\boxed{01}$ = $\boxed{01}$ 45 000

මිල - 2 100 $\boxed{01}$

මිල = 300 + 2 100

= 2 400

(6) විශ්‍රාමික ගුරුවරුන්ට ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීම අවශ්‍ය නොවන්නේ නම් සහ ඔවුන්ගෙන් 24 දෙනෙකු පැමිණීම අපේක්ෂා කරන්නේ නම් මුළු පිරිවැය ආවරණය කර ගැනීමට විකිණිය යුතු ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව = 106 (02)

පෙරවැඩ

$$= \frac{\text{ආවරණය කර ගත යුතු පිරිවැය}}{\text{ඒකක දායකය}}$$

$$= \frac{45\,000 + 50\,400\ \boxed{01}}{\boxed{01}\ 900}$$

$$= \underline{106}$$

(ලකුණු 20)
(මුළු ලකුණු 30)

5 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
5 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 70%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 32%ක් වන අතර අපේක්ෂකයින්ගෙන් ලකුණු 07 හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇති ප්‍රතිශතය 23%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ට වඩා ලබාගත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 56%ක් වීමද සැළකිය යුතු තත්ත්වයකි.



මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 9න් කොටස් 5ක පහසුතාව 76% වඩා ඉහළය. ඉහළම පහසුතාව (අ) (3) 89% කි. (ආ) (1) 85%කි. අඩුම පහසුතාව (අ) (1) 66%ක්ද, (ආ) (6) 27%ක් ද වේ.

(5) (අ) (1) කොටසේ පහසුතාව 66%ක් වන අතර මෙයින් පිරික්සා ඇත්තේ මුදල් ගලා ඒම් සහ ගලා යාම් පිළිබඳ දැනුමයි. පැරණි යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රය මිලදී ගැනීම නිසා වන වාර්ෂික මුදල් ප්‍රවාහයේ ඉතිරිය මුදල් ගලා ඒමක් ලෙස හඳුනා නොගැනීම මීට හේතු විය හැක. මේ පිළිබඳ අවබෝධය ලැබෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

(ආ) (3) කොටසේ පහසුතාව 68%ක් දායකය හා ස්ථාවර පිරිවැය ප්‍රයෝජනයට ගෙන ලාභය සොයා ඇති බව හා එම ලාභය පුන්‍ය කටයුත්තකට යොදවන බව අවබෝධ කරගෙන නොමැති වීම විය හැකිය.

(ආ) (5) පහසුතාව 58%කි. මුළු පිරිවැය සහභාගී වන ගුරුවරු සංඛ්‍යාවෙන් බෙදා ප්‍රවේශ පත්‍රයක් විකිණිය හැකි අවම මිල තීරණය වන බව අවබෝධ නොවීම විය හැකිය.

(ආ) (6) පහසුතාව 27%කි. විශ්‍රාමික ගුරුවරුන් විසින් ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීම අවශ්‍ය නොවීම මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩුවීමට හේතු විය හැකිය. ඔවුන්ගෙන් 24 දෙනෙකු පැමිණීම අපේක්ෂා කිරීම සඳහා වූ පිරිවැය, ස්ථාවර පිරිවැයට එකතු කිරීම පිළිබඳ අපේක්ෂකයින් තුළ අවබෝධය අඩුවීම මෙයට හේතුව ලෙස දැක්විය හැකිය.

06 ප්‍රශ්නය

6. (අ) 2016.03.01 දින ස්ථාපිත කරන ලද මිගාර අධ්‍යාපන ආයතනය පාසල් හැර යන්නන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි. ආයතනයෙහි ස්ථිර ගුරුවරුන් දෙදෙනෙකු සහ තාවකාලික ගුරුවරයකු සේවයේ යොදවා ඇත. එක් ගුරුවරයකු මසකට පැය 120 ක් ඉගැන්විය යුතු ය.

(i) ගුරුවරුන්ගේ දළ වැටුප පහත අයිතමයන්ගෙන් සමන්විත වේ:

- ඉගැන්වීම සඳහා ගෙවීම් (පැය 120 සඳහා):

ස්ථිර-එක් ගුරුවරයකුට	මාසිකව	රු. 75 000
තාවකාලික	පැයකට	රු. 500
• අතිරේක සැසි පැවැත්වීම සඳහා ගෙවීම්	පැයකට	රු. 750
• පිළිතුරුපත්‍ර ලකුණු කිරීමේ ගාස්තු	පත්‍රයකට	රු. 100

(ii) 2016 මාර්තු මාසය සඳහා ඉගැන්වූ පැය ගණන සහ ලකුණු කළ පිළිතුරුපත් සංඛ්‍යාව පහත පරිදි වේ.

විස්තරය	ස්ථිර:		තාවකාලික:
	නන්දනී	යුරේෂ්	මංජුල
මාසය තුළ වැඩ කළ පැය ගණන	140	160	180
ලකුණු කළ පිළිතුරුපත් සංඛ්‍යාව	100	150	200

(iii) සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවක භාරකාර අරමුදල් (ETF) දායකත්වයන්, ස්ථිර මෙන් ම තාවකාලික ගුරුවරුන්ගේ දළ වැටුප මත පදනම් වේ. සේව්‍යයා සහ සේවක EPF දායකත්වයන් පිළිවෙළින් 15% ක් සහ 10% ක් වේ. ETF සඳහා සේව්‍යයාගේ දායකත්වය 3% ක් වේ.

අවශ්‍යවන්නේ:

2016 මාර්තු මාසය සඳහා:

(1) වැටුප් ලේඛනය
(2) වැටුප් පාලන ගිණුම

(ලකුණු 05 යි)

පිළිතුර

ප්‍රශ්න අංක 06

(අ) (1)

මිගාර අධ්‍යාපන ආයතනය

2016 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය

සේවකයාගේ නම	මූලික වැටුප	අතිරේක සැසි දීමනා	පිළිතුරු පත්‍ර දීමනා	දළ වැටුප	සේවක අර්ථ සාධක අරමුදල්	ශුද්ධ වැටුප	සේවය EPF දායකය	සේවය EPF දායකය
නන්දනී	75 000	15 000	10 000	10 000	10 000	10 000	15 000	3 000
සුරේෂ්	75 000	30 000	15 000	120 000	12 000	108 000	18 000	3 600
මංජුල	60 000	45 000	20 000	125 000	12 500	112 500	18 750	3 750
	210 000	90 000	45 000	345 000	34 500	310 500	51 750	10 350
	(01)	(01)	(01)	(01)	(01)	(01)	(01)	(01)

(ලකුණු 07)

(2) වැටුප් පාලන ගිණුම (රු'000)

සේවක අර්ථ සාධක අරමුදල	(01)	34 500	වැටුප් හා වේතන	(01)	345 000
මුදල්/ගෙවිය යුතු වැටුප්	(01)	310 500			
		345 000			345 000

(ලකුණු 03)

(ආ) 2013.04.01 දින පාසලක ආදි ශිෂ්‍යාවන්ගේ සංගමයක් ස්ථාපිත කරන ලදී. එහි ආරම්භක සාමාජිකාවන් රු. 500 000 ක් දායක වෙමින් යාවජීව සාමාජිකයින් ලෙස බැඳුනි. මෙම සංගමයේ පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

විස්තරය	**2016.03.31 දිනට (රු.'000)**	**2015.03.31 දිනට (රු.'000)**
ලැබිය යුතු සාමාජික මුදල්	20	15
කලින් ලද සාමාජික මුදල්	30	25
සමුච්චිත අරමුදල	?	200
යාවජීව සාමාජික අරමුදල	?	400
ටී ෂර්ට් තොගය - පිරිවැයට	40	-
ශාලාව වෙන්කිරීමේ අත්තිකාරම	-	25
සංගීත ප්‍රසංගයෙන් ලැබිය යුතු දෑ	?	-
මුදල්	?	50

අතිරේක තොරතුරු:

(i) එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 500 කි. 2016.03.31 දිනට සාමාජිකයන් 600 දෙනෙකු (යාවජීව සාමාජිකයින් හැර) විය.

(ii) යාවජීව සාමාජික මුදල වසර 10 ක කාලයක් තුළ ආදායමෙහි හඳුනා ගැනේ.

(iii) සංගමයට අරමුදල් රැස් කිරීම සඳහා 2015.10.01 දින පවත්වන ලද සංගීත ප්‍රසංගයට පහත තොරතුරු අදාළ වේ:

විස්තරය	මුදල් ලැබීම්/ගෙවීම් (රු.'000)
ප්‍රවේශ පත්‍ර විකුණුම්:	
එකක් රු. 1 000 බැගින් වන ප්‍රවේශ පත්‍ර 100 ක්	100
එකක් රු. 500 බැගින් වන ප්‍රවේශ පත්‍ර 400 ක් (80% ක් පමණක් ලැබුණි)	160
ප්‍රසංගය සඳහා අනුග්‍රාහක දායකත්වයන් (75% පමණක් එකතු කර ඇත)	375
සංගීතඥයින්ට ගෙවීම්:	
එක් අයෙකුට රු. 40 000 බැගින් ගායකයින් 5 දෙනෙකුට	200
සංගීත කණ්ඩායමට	80
ශාලා කුලිය	50
සංග්‍රහ වියදම්	30

(iv) සංගමය විසින් එකක් රු. 200 බැගින් ටී ෂර්ට් 500 ක් අත්පිට මුදලට මිලට ගන්නා ලදී. මෙයින් 300 ක්, එකක් රු. 250 බැගින් සාමාජිකයින් අතරේ අත්පිට මුදලට විකුණන ලදී.

(v) පරිපාලන සහායකට රු. 30 000 ක මාසික වැටුපක් ගෙවනු ලැබේ.

අවශ්‍යවන්නේ:

(1) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම

(2) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ:

(i) සාමාජික මුදල් ආදායම

(ii) සංගීත ප්‍රසංගයේ අතිරික්තය/හිඟය

(iii) ටී-ෂර්ට් විකිණීමෙන් ලද අතිරික්තය/හිඟය

(3) 2016.03.31 දිනට පහත අයිතමවල ශේෂයන්:

(i) සමුච්චිත අරමුදල

(ii) යාවජීව සාමාජික අරමුදල

(iii) සංගීත ප්‍රසංගයෙන් ලැබිය යුතු දෑ

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 15 යි)

(ආ) (1) මුදල් ගිණුම (රු'000)

ශේෂය ඉ/ගෙ	50		ගායකයින්ට ගෙවීම්	200	
ප්‍රවේශ පත්‍ර විකිණීම	260	(01)	සංගීත කණ්ඩායමට ගෙවීම්	80	(02)
අනුග්‍රාහක දීමනා	375	(01)	ශාලා කුලිය	50	
සාමාජික මුදල්	300	(01)	සංග්‍රහ වියදම්	30	
ටී ෂර්ට් විකුණුම්	75	(01)	ටී ෂර්ට් විකුණුම්	100	(01)
			වැටුප්	360	(01)
			ශේෂය ප/ගෙ	240	
	1 060			1 060	

(ලකුණු 08)

(ආ) (2) (රු'000)

(i) සාමාජික මුදල් ආදායම = රු. 350 (01)

පෙරවැඩ		(රු'000)	
සාමාජික මුදල් = 600 × 500	=	300	
යාවජීව සාමාජික මුදල්	=	50	01
		350	

(ii) සංගීත ප්‍රසංගයේ අතිරික්තය = රු. 415 (04)

පෙරවැඩ (රු'000)

සංගීත ප්‍රසංග ගිණුම

ගායකයින්ට ගෙවීම්	200		ප්‍රවේශපත්‍ර විකුණුම්	300	01
සංගීත කණ්ඩායමට ගෙවීම්	80	01	අනුග්‍රාහක දීමනා	500	01
සංග්‍රහ වියදම්	30				
ශාලා කුලිය	75	01			
අතිරික්තය	415				
	800			800	

(iii) ටී ෂර්ට් විකිණීමෙන් ලද අතිරික්තය = රු. 15 (02)

පෙරවැඩ (රු'000)

ටී ෂර්ට් විකුණුම් 300 × 250	=	75	01
ටී ෂර්ට් විකුණුම් පිරිවැය 300 × 200	=	(60)	01
		15	

(ලකුණු 07)

(3) (i) 2016.03.21 දිනට සමුච්චිත අරමුදල 620 (02)

පෙරවැඩ (රු'000)

2015.04.01 සමුච්චිත අරමුදල	-	200	
අතිරික්තය	-	420	02
		620	

ආදායම් ප්‍රකාශනය

ආදායම්		
සාමාජික මුදල්	300	
යාවජීව සාමාජික මුදල්	50	
සංගීත ප්‍රසංගයෙන්	415	ඕනෑම අයිතම 4කට ලකුණු 02
ටී ෂර්ට් විකිණීමෙන්	15	
	780	
වියදම්		
පරිපාලක සහයක වැටුප්	(360)	
අතිරික්තය	420	

(රු'000)

(ii) යාවජීව සාමාජික අරමුදල 350 (01)

(රු'000)

(iii) සංගීත ප්‍රසංගයෙන් ලැබිය යුතු මුදල 165 (02)

පෙරවැඩ		(රු'000)	
ප්‍රවේශපත්‍ර වලින් ලැබිය යුතු මුදල	=	40	01
අනුග්‍රාහකයින්ගෙන් ලැබිය යුතු මුදල	=	125	01
		165	

(ලකුණු 05)

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය
15 x 2 = ලකුණු 30කි.
6 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 52%ක් පමණි.

ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 48%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 7%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වඩා වැඩියෙන් ලකුණු ලබාගත් පිරිස 7%ක් පමණක් වන අතර, අපේක්ෂකයින්ගෙන් 48%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට වඩා අඩුවෙනි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ට වඩා වැඩියෙන් ලබාගෙන ඇති ප්‍රතිශතය 21%ක් පමණි. එම සැලකිය යුතු දුර්වලතාවයකි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 02න් (අ) කොටසෙහි පහසුතාව 65%කි. (ආ) කොටසෙහි අනුකොටස් (3) කි. මෙම කොටස් සියල්ලෙහිම පහසුතාව 47%-13% අතර වේ.

(6) (අ) කොටසෙහි අනුකොටස් දෙකෙහිම පහසුතාව 65%කි. මෙයින් පිරික්සා ඇත්තේ වැටුප් ලේඛනය සහ වැටුප් පාලන ගිණුම සකස් කිරීම පිළිබඳ අවබෝධයයි. අපේක්ෂකයින් තුළ දළ වැටුප ගණනය කිරීම පිළිබඳ අවබෝධය දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) කොටසෙහි (1) පහසුතාවය 47%කි. මුදල් ගිණුම පිළියෙල කිරීමේදී දී ඇති අතිරේක තොරතුරු සැලකිල්ලට ගෙන නොතිබීම දක්නට ලැබිණි.

(ආ) (2) (1) කොටසෙහි පහසුතාවය 29%කි. ගිණුම්කාලච්ඡේදයට අදාළ යාවජීව සාමාජික මුදල, සාමාජික මුදල් ගිණුමට නිවැරදි ව ගලපා නොතිබීම දක්නට ලැබුණි.

(ආ) (2) (ii) පහසුතාවය 31%කි. ප්‍රවේශ පත්‍ර විකුණුම් ආදායම ගණනය කිරීමේදී උපචිත පදනම සැලකිල්ලට නොගැනීම හා අනුග්‍රාහක දායකත්වයන්ගෙන් ගිණුම්කාලච්ඡේදයට අදාළ ලෙස ගලපා නොතිබීම, ශාලා කුලී වෙන් කිරීමේ අත්තිකාරම හා ගෙවූ ශාලා කුලිය යන දෙකම කාලච්ඡේදයේ ශාලා කුලිය ලෙස හඳුනා ගෙන තිබුණේ නැත.

ආ (2) (iii) පහසුතාවය 42%කි. ටී ෂර්ට් විකුණුම් පිරිවැය නිවැරදි ව ගණනය කර නොතිබීම හා පිළිතුරු නොසපයා තිබීම.

(ආ) (3) (i) පහසුතාවය 13%කි. සමුච්චිත අරමුදල ගොඩනැගෙන ආකාරය පිළිබඳ අපේක්ෂකයින්ගේ අවබෝධය ඉතා අඩුය. නිවැරදි අතිරික්තය ගණනයේදී කාලච්ඡේදයට අදාළ නිවැරදි ආදායම් හා වියදම් ගණනය කර නොතිබීම. සමුච්චිත අරමුදල ගොඩනැගෙන ආකාරයට පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

(ආ) (3) (ii) පහසුතාවය 28%කි. යාවජීව සාමාජිකත්වය ලබාගත් දිනය සැලකිල්ලට ගෙන නොතිබීම. ඒ අනුව ගිණුම්කාලච්ඡේදයට අදාළ යාවජීව සාමාජික මුදල හඳුනා නොගැනීම මෙයට හේතුවේ.

(ආ) (3) (iii) පහසුතාවය 31%කි. ප්‍රවේශ පත්‍රවලින් ලැබිය යුතු මුදල හා අනුග්‍රාහකයින්ගෙන් ලැබිය යුතු මුදල හඳුනා ගෙන නොතිබීම ඊට හේතු විය හැකිය.

මෙම සෑම අනුකොටසකටම පිළිතුරු සැපයීමේදී උපචිත පදනම පිළිබඳ අවබෝධය අඩුබවක් දක්නට ලැබුණි. එම නිසා උපචිත පදනමට ගිණුම් තැබීම පිළිබඳ අවබෝධය තහවුරු වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම සංවිධානය කළ යුතුව ඇත.

07 ප්‍රශ්නය

7. (අ) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත උපුල් පොදු සමාගම හා බැඳේ.

දළ ලාභ අනුපාතය	20%
වත්කම් පිරිවැටුම් අනුපාතය	වාර 0.5
තොග පිරිවැටුම් අනුපාතය	වාර 8
දළ ලාභය	රු. 400 000
මුළු වියදම්	රු. 160 000
2016.03.31 දිනට මුළු වගකීම්	රු. 1 600 000

අවශ්‍යවන්නේ:

(1) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම්
(2) 2015/16 වර්ෂය සඳහා සාමාන්‍ය තොගය
(3) 2016.03.31 දිනට මුළු වත්කම්
(4) හිමිකම මත ඉපැයුම් අනුපාතය
(5) හිමිකම් අනුපාතය

(ලකුණු 05 යි)

පිළිතුර

ප්‍රශ්න අංක 07

(අ) (1) විකුණුම් රු. 2 000 000 (02)

පෙරවැඩ

$$\frac{400\ 000}{20\%} \overset{[01]}{=} 2\ 000\ 000 \quad [01]$$

(2) සාමාන්‍ය තොගය රු. 200 000 (02)

පෙරවැඩ

$$\frac{1\ 600\ 000}{8\ \%} \overset{[01]}{=} 200\ 000 \quad [01]$$

(3) මුළු වත්කම් රු. 4 000 000 (02)

පෙරවැඩ

$$\frac{2\ 000\ 000}{0.5\ \%} \quad [01] \quad [01]$$

(4) හිමිකම් මත ඉපැයුම් අනුපාතය 10% (02)

පෙරවැඩ

$$\frac{240\ 000}{2\ 400\ 000} \overset{[01]}{\times} 100 = 10\% \quad [01]$$

(5) හිමිකම් අනුපාතය 60% (02)

පෙරවැඩ

$$\frac{2\ 400\ 000}{4\ 000\ 000} \overset{[01]}{\times} 100 = 60\% \quad [01]$$

(ආ) 2016.03.31 සහ 2015.03.31 දිනයන්ට සීමිත නායගම් පොදු සමාගමේ සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දී ඇත.

විස්තරය	2016.03.31 දිනට (රු.'000)	2015.03.31 දිනට (රු.'000)
දේපළ, පිරියත සහ උපකරණ-ප්‍රත්‍යාගණන වටිනාකමට	312	240
සමුච්චිත ක්ෂය - දේපළ, පිරියත සහ උපකරණ	(72)	(40)
තොගය	184	104
වෙළෙඳ ලැබිය යුතු දෑ	80	120
අඩමාන ණය සඳහා වෙන් කිරීම්	(32)	(16)
මුදල්	192	–
මුළු වත්කම්	**664**	**408**
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	280	40
ප්‍රත්‍යාගණන සංචිත	56	16
රඳවාගත් ඉපැයුම්	32	96
දිගුකාලීන ණය	120	–
වෙළෙඳ ගෙවිය යුතු දෑ	136	144
ගෙවිය යුතු වැටුප්	40	32
බැංකු අයිරාව	–	80
මුළු වගකීම් සහ හිමිකම්	**664**	**408**

අතිරේක තොරතුරු:

(i) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත පරිදි වේ.

විස්තරය	රු.'000
විකුණුම්	120
විකුණුම් පිරිවැය	(80)
කොමිස් ආදායම (වර්ෂය අවසානයේ ලැබිය යුතු දෑ නොමැත.)	8
ලී බඩු විකිණීම මත ලාභය (එහි ධාරණ වටිනාකම රු. 40 000 ක් විය.) ...	16
අඩමාණ ණය	(16)
ක්ෂය	(40)
වැටුප්	(72)
වර්ෂයේ අලාභය	(64)

(ii) වර්ෂය තුළ දී දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කර ඇත. වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ මිල දී ගැනීම් අත්පිට මුදලට සිදු කර ඇත.

(iii) වර්ෂය තුළ දී කොටස් නිකුතුවක් සිදු කර ඇති අතර 2016.03.31 දින වසර 3 ක කාලයක් සඳහා ණයක් ලබා ගෙන ඇත.

අවශ්‍යවන්නේ:

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත නායගම් පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(ලකුණු 10 යි)
(මුළු ලකුණු 15 යි)

පිළිතුර

(3) සීමිත නායගම් පොදු සමාගම

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (01)

මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ			
බදු පෙර ලාභය		(64) (01)	
ක්ෂය		40 (01)	
ලී බඩු විකිණීම මත ලාභය		(16) (01)	
අඩමාන ණය		16 (01)	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල යෙදවූ මුදල්		(24)	
තොග වැඩිවීම		(80) (01)	
වෙළෙඳ ලැබිය යුතු දෑ අඩුවීම		40 (01)	
වෙළෙඳ ගෙවිය යුතු දෑ අඩුවීම		(8) (01)	
ගෙවිය යුතු වැටුප් වැඩි වීම		8 (01)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළ යෙදවූ ශුද්ධ මුදල් (01)			(64)
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනුම්		(80) (02)	
ලී බඩු විකිණීමෙන් ලද මුදල		56 (02)	
ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් (01)			(24)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ			
කොටස් නිකුත් කිරීම්		240 (01)	
ණය ලබා ගැනීම		120 (01)	
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් (01)			360
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම			272
2015.04.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ			(80) (01)
2016.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ			192 (01)

(ලකුණු 20)

පෙරවැඩ දේපල, පිරියත සහ උපකරණ ගිණුම **රු'000**

ශේෂය ඉ/ගෙ	240		ලී බඩු	48	01
මුදල්	40	01	ශේෂය ප/ගෙ	312	
	80				
	360			360	

ලී බඩු විකුණුම් ගිණුම

ලී බඩු	48	01	සමුච්චිත අගය	8	01
ලාභාලාභ	16		මුදල්	56	
	64			64	

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය
15 x 2 = ලකුණු 30කි.
7 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 66%ක් පමණි.

ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 18%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් පිරිස 18%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 28%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07ක් හෝ ඊට අඩුවෙනි. මෙම ප්‍රශ්නයෙහි ලකුණු 16ට වඩා ලබාගත් ප්‍රතිශතය 42%කි.



මෙම ප්‍රශ්නයෙහි අනුකොටස් 6ක් අතුරින් කොටස් 4ක පහසුතාවය 55%ට වැඩිය.

(7) (අ) (1) කොටසේ පහසුතාව 80%කි. මූලික ගණිත සංකල්ප පිළිබඳ අවබෝධය නොතිබීම නිසා 20% පමණ අපේක්ෂකයින් පිළිතුරු සපයා නැති බව පෙනේ.

(7) (අ) (2) කොටසේ පහසුතාවය 66%කි. විකුණුම් පිරිවැය ගණනය කිරීමේ අපහසුව නිසා සාමාන්‍ය තොගය ගණනය කළ නොහැකිවීම ආදිය ඊට හේතු විය හැකිය.

(7) (අ) (3) කොටසේ පහසුතාවය 57%කි. පිරිවැටුම ගණනය කිරීමේ අපහසුව නිසා මුළු වත්කම් ගණනය කිරීම අපහසුවීම විය හැකිය.

(7) (අ) (4) කොටසේ පහසුතාවය 45%කි. මුළු වත්කම් - වගකීම් = හිමිකම් බව හඳුනා නොගැනීම හා දළ ලාභයෙන් මුළු වියදම අඩුකර ශුද්ධ ලාභය හෙවත් ඉපයුම ලබන බව අවබෝධ කරගෙන නොතිබුණ බව පෙනේ.

(7) (අ) (5) කොටසේ පහසුතාවය 26%කි. හිමිකම ගණනය කිරීම හා මුළු ප්‍රාග්ධනය ගණනය කිරීම පිළිබඳ අවබෝධය නොමැතිවීම මීට හේතු විය.

අනුපාත ගණනය කිරීමේදී සූත්‍ර පිළිබඳ අවබෝධය ලැබෙන ආකාරයට විවිධ වූ අභ්‍යාස කරවීම යෝග්‍ය වේ.

(7) (ආ) කොටසේ පහසුතාවය 55%කි. මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඩමාණ ණය උෆන වෙන් කිරීම මුදල් ප්‍රවාහයට බල නොපාන අයිතමයක් බව හඳුනා ගෙන නොතිබුණි.

බදු පෙර අලාභයක් පෙන්වීම නිසා, ඒ අනුව මුදල් ප්‍රවාහ පිළියෙල කිරීමට අපේක්ෂකයින් හුරු නොවීම.

මුදල් පොතට හර බැර වූ එහෙත් ලාභාලාභ ගිණුමට හර බැර නොවූ අයිතම නැවත ගැලපීම් කළ යුතු බව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී අවබෝධ කළ යුතුවේ.

මෙහෙයුම්, ආයෝජන, මූල්‍ය ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහයට අදාළ ව අගයක් දැක්වීම කළ යුතු බව අවබෝධ කළ යුතුවේ.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



II ප්‍රශ්න පත්‍රයේ 6 වන ප්‍රශ්නය හැර අනෙකුත් ප්‍රශ්නවල පහසුතාවය 55% හෝ ඊට වැඩිය.

II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අතරින් 72%ක වැඩිම පහසුතාවක් 5 වන ප්‍රශ්නයට දක්වා ඇති අතර 48%ක අඩුම පහසුතාවක් දක්වා ඇත්තේ 6 වන ප්‍රශ්නයටය.

පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය වේ. මෙම ප්‍රශ්න දෙක අතුරින් වැඩිම පහසුතාවක් දක්වා ඇත්තේ 2 වන ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 69%කි.

3 වන ප්‍රශ්නයේ සිට 7 වන ප්‍රශ්නය තෙක් ලබාදී ඇත්තේ, තෝරා ගන්නා ප්‍රශ්න වන අතර ඉන් වැඩිම පහසුතාවක් දක්වා ඇත්තේ 5 වන ප්‍රශ්නයට වේ. එහි පහසුතාව 72%කි. ප්‍රශ්න තෝරා ගැනීමේදී වැඩිම පිරිසක් තෝරාගෙන ඇත්තේ 3 වන ප්‍රශ්නය වේ. මෙහි ප්‍රතිශතය 93%ක් වේ. දෙවන ප්‍රශ්න පත්‍රයේ තෝරා ගන්නා ප්‍රශ්නවලින් අඩුම තෝරාගැනීමක් දක්වා ඇත්තේ 6 වන ප්‍රශ්නය වන අතර එය 52%කි.
තෝරා ගන්නා ප්‍රශ්න අතරින් දෙවනුව වැඩිම පිරිසක් තෝරා ගෙන ඇත්තේ 5 වන ප්‍රශ්නය වන අතර එහි තෝරා ගැනීම 79%කි.

III කොටස

3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

පොදු උපදෙස් :

* ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් කුමන ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතුද? කුමන ප්‍රශ්න අනිවාර්ය වේද, ඒ සඳහා වෙන් කොට ඇති කාලයන් කොපමණ ද? වෙන් කොට ඇති ලකුණු ප්‍රමාණයන් කොපමණද යනාදියයි.
* ප්‍රශ්න හොඳින් කියවා අවබෝධ කරගෙන තෝරා ගත යුතු අතර, ප්‍රශ්න තෝරා ගැනීමේදී හා පිළිතුරු ලිවීමේදී එය ප්‍රයෝජනයට ගත යුතුය.
* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් ලිවිය යුතුය.
* අයඳුම්කරුගේ විභාග අංකය අදාළ සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
* I පත්‍රයේ 1-30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් ආසන්න පිළිතුරු අතුරින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ගත යුතුය.
* I පත්‍රයේ 31-50 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී දීර්ඝ විස්තර ඇතුළත් කිරීම නොකළ යුතුය.
* II වන පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අළුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
* උත්තර පත්‍රයට පිටු අමුණන්නේ නම් නිවැරදිව අංක කර නොගැලවෙන පරිදි ඇමිණිය යුතුය.
* ප්‍රශ්න අංක හා අනුකොටස් අංක නිවැරදි ව ලිවිය යුතුය.
* ප්‍රශ්නයෙහි අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.
* එක් එක් අනු කොටස් හොඳින් කියවා බලා එක් එක් අනු කොටසට අදාළ ඉලක්කගත පිළිතුර පමණක් ලිවිය යුතුය.
* පිළිතුරු සැපයීමේදී කාලය නිසි පරිදි කළමනාකරණය කරගත යුතුය. මෙහිදී ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය සමග කාලය කළමනාකරණය කරගත හැකිය.
* පිළිතුරු ලිවීමේදී රතු, දම් සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

විශේෂ උපදෙස් :

1. ප්‍රශ්නවලට අදාළ පිළිතුර පියවරෙන් පියවර ඉදිරිපත් කළ යුතුය.
2. සංඛ්‍යා රුපියල් දහස්වලින් ඉදිරිපත් කරන්නේ නම් එය සඳහන් කළ යුතුය. (එනම් රු'000 ලෙස)
3. එක් එක් ප්‍රශ්නයට අදාළ පෙර වැඩ ඒ ඒ පිළිතුර සමග ඉදිරිපත් කළ යුතුය.
4. ප්‍රශ්නයක අනුකොටස් ඇති විටෙක එම අනුකොටස් සියල්ල එක ලග තිබෙන ලෙස පිළිතුරු ඉදිරිපත් කළයුතු අතර උත්තර පත්‍රයෙහි තැනින් තැන විසුරුවා ලිවීම නොකළ යුතුය.
5. ඉලක්කම් සහ ධන සෘණ ලකුණු ද, සත්‍ය අසත්‍ය බවද අදාළ වේ, අදාළ නොවේ ආදිය ද පැහැදිලි ව ලිවිය යුතුය.
6. තමා ලද අගය භාවිත කරමින් සම්පූර්ණ පිළිතුර සැපයිය යුතුය. එනම් ලද එක් පිළිතුරක් වැරදි යැයි උපකල්පනය කොට ඉතිරි කොටස්වලට පිළිතුරු නොලියා සිටීමෙන් වැළකිය යුතුය.
7. සමාගම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ සටහන් හා පෙරවැඩ අතර වෙනස වටහා ගෙන පිළිතුරු සැපයීමට වගබලා ගත යුතුය.
8. ආදායම් හා වියදම් උපචිත පදනමට ගලපා ගැනීමට අපොහොසත් වීම බොහෝ පිළිතුරුවල පොදුවේ දක්නට ලැබෙන දුර්වලතාවයක් බැවින් ඒ පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කළ යුතුය.
9. මූලික ගණිත සංකල්ප පිළිබඳ අවබෝධය මදවීම ද නිවැරදි පිළිතුරු ලබාගැනීමට බාධාවක් බැවින් එය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* විෂය නිර්දේශය, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත, 2007 අංක 07 දරන සමාගම් පනත, උසස් පෙළට නිර්දේශිත ගිණුම්කරණ ප්‍රමිත සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පළකර ඇති උ.පෙළ ගිණුම්කරණය සම්බන්ධ පොත් යනාදිය සියළුම සිසුන් මෙන්ම ගුරුභවතුන් ද පරිශීලනය කළයුතු අතර ඒ පිළිබඳ ව දැනුවත් වීම හා භාවිතය ද අත්‍යාවශ්‍යය.

* ගිණුම්කරණ ප්‍රශ්න පත්‍රයට සාර්ථකව පිළිතුරු ලිවීමට නම් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී ප්‍රායෝගික ගැටළු මුල් කරගෙන සකස් කළ අභ්‍යාස ශිෂ්‍යයා ලවා කරවීම අවශ්‍යය.

* මුද්‍රණය කරන ලද අභ්‍යාස ලබාදීමට හැකියාවක් ඇත්නම් වැඩි අභ්‍යාස ප්‍රමාණයක් විසඳීමට සිසුන්ට අවස්ථාව ලැබෙනු ඇත.

* සාක්ෂරතාවයේ අඩුපාඩු හේතුවෙන් ප්‍රශ්න අවබෝධ කරගැනීමේ සහ ප්‍රකාශනය කිරීමේ ගැටළු අවම කර ගැනීම සඳහා සුදුසු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය.

* ව්‍යාපාර ලෝකයේ ප්‍රායෝගිකව භාවිත කරන මූලාශ්‍ර ලියවිලි හා ගිණුම් වාර්තා පත්ති කාමර ආධාරක ලෙස භාවිත කරමින් විෂයය සංවර්ධනයට අවශ්‍ය අත්දැකීම් තහවුරු කර ගැනීමට මග පෙන්වීම අවශ්‍යය.
  නිදසුන් - මූලාශ්‍ර ලියවිලි
  - බැංකු ප්‍රකාශන
  - වැටුප් ලේඛන
  - තොග වාර්තා
  - සමාගම් වාර්ෂික වාර්තා

* මෙම විෂය ඉගෙන ගන්නාට මෙන්ම සමාජයටද එකසේ වැදගත් වන බැවින් අවබෝධයෙන් යුතුව, තර්කානුකූලව, මනසට රසවත් වන ආකාරයට ඉගෙන ගත යුතු අතර එක් එක් ඒකකය ඉගෙන ගත යුත්තේ මන්ද යන්න දරුවාගේ මනසට අවධාරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

* මෙම විෂය තීරණ ගැනීම සඳහා වැදගත් වන සමාජයීය විෂයයක් බැවින් ඉගෙනුම් උපකරණ හා මෙවලම් භාවිතය මගින් ප්‍රබෝධක ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීමට හා කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාව ලබාදිය යුතුය.

* විෂය නිර්දේශයේ අවසාන විෂයය කොටස් පදනම් කරගෙන ඇතුළත් කර ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ ප්‍රවණතාවයේ අඩුවීමක් මෙන් ම එම කොටස් සඳහා ලකුණු ලබා ගැනීමේ ප්‍රවණතාවේ අඩුවීමක් ද නිරීක්ෂණය වේ. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී එම විෂය කොටස් ආවරණය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වනු ඇත.

* නව විෂය දැනුම සංවර්ධනය කර ගැනීම හා යාවත්කාලීන වීමට විශේෂයෙන් ගුරු භවතුන් සැලකිලිමත් විය යුතු අතර, ශිෂ්‍යයින්ට ද එම කරුණ වැදගත් වේ. මෙමගින් කුසලතා පුර්ණ නිර්මාණශීලි පුද්ගලයන් බිහිවන අතර ඔවුන් මතු පරපුරට මහගු දායාදයකි.